සැ. යු. - 2010.07.30 දින පළවූ අංක 1,665 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,666 - 2010 අගෝස්තු මස 06 වැනි සිකුරාදා - 2010.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1438 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 1441 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1448 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 අගෝස්තු මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූලි මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 109

DIRF/RECT/265/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

පහත නම සඳහන් මහත්මා 2009.10.15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බළ සේනාවේ ලුතිතන් කර්නල් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එම දින සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

කළුතන්ත්‍රිගේ දොන් දුමින්ද මහතා

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.

08-55

2010 අංක 110

DIRF/RECT/88(vii)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත සඳහන් කෙඩෙට් නිලධාරි/නිලධාරිනිය 2009 සැප්තැම්බර් මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බළ හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු සේවා බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/56758 කෙඩෙට් නිලධාරි, මීගස්වත්තේ දිසානායක මුදියන්සේලාගේ ශිරාන් බණ්ඩාර මීගස්වත්තේ
සී/56775 කාන්තා කෙඩෙට් නිලධාරි සෝමරත්න විදාන ආරච්චිගේ දෝන රුවිනි රුක්මාල් පෙරේරා

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.

08-143

# රජයේ නිවේදන

**වන්දනා ගමන් ආඥාපනත**

මාතර මැණියන්ගේ දේවස්ථානයේ වාර්ෂික උත්සවය

මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාතර මැණියන්ගේ දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය 2010 සැප්තැම්බර් මස 10 වැනි දින සිට 12 වැනි දින දක්වා පැවැත්වෙන බව (175 වැනි අධිකාරය වන) වන්දනා ගමන් ආඥාපනත යටතේ සකස් කොට 1991 නොවැම්බර් මස 01 වැනි දින හා අංක 687 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන රෙගුලාසිවල 02 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

තුසිත පී. වනිගසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2010 ජූලි මස 19 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-68

**වන්දනා ගමන් ආඥාපනත**

මාතර බිනර මහා පෙරහැර

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන 2010 බිනර මහා පෙරහැර 2010 සැප්තැම්බර් මස 22 වැනි දින පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනත යටතේ (175 පරිච්ඡේදයේ) 1959 නොවැම්බර් මස 20 වැනි දින නිකුත් කරන ලද 11959 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසිවල 10 වැනි වගන්තිය යටතේ මෙයින් දන්වමි.

තුසිත පී. වනිගසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2010 ජුනි මස 19 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-66

අංකය : ප්‍ර. නො. 11/2/35/06/2010 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2010.08.09 වැනි දින සිට 2010.08.23 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00ට සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2010.08.30 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**උපලේඛනය**

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තරය* | *ලියාපදිංචි කල ඔප්පුවල විස්තරය* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ජී" දරන කොට්ඨාසයේ 344 වෙළුමේ 279 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, බත්තරමුල්ල, තලංගම නගර සභා සීමාව තුළ බත්තරමුල්ල ගමේ පිහිටි මීගහකැටියවත්ත නමැති ඉඩමේ සී2 ලකුණු කොට බෙදා වෙන් කළ අ. 0, රූ. 0, පර්. 30 විශාල ඉඩම් කොටසට සිරි ඩී. ලියනසූරිය මානක තැනගේ 1978.08.27 දින අංක 1605 දරන පිඹුර ප්‍රකාර මායිම්,<br>*උතුරට* : සී 1,<br>*නැගෙනහිරට* : ලොට් සී 3 සහ සී 4,<br>*දකුණට* : ලොට් සී 3 සහ ඩැනියෙල් සහ තව අයට අයිති කුඹුර,<br>*බස්නාහිරට* : ක්ලෙමන්ට් ඩයස්ට අයිති මෙම ඉඩමේ ලොට් බී. | 1. එල්. හිරිමුතුගොඩ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1978.09.04 වැනි දින ලියා සහතික කළ අංක 309 දරන තෑගි ඔප්පුව<br>2. එල්. හිරිමුතුගොඩ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1979.08.25 දින ලියා සහතික කළ අංක 497 දරන උකස් ඔප්පුව<br>2. එල්. හිරිමුතුගොඩ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1980.01.02 සහ 1980.02.27 දින ලියා සහතික කරන ලද අංක 574/613 දරන වරද නිවැරදි කිරීමේ ඔප්පුව |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-60

---

**1980 අංක 56, 1977 අංක 9, 1976 අංක 18 සහ 1974 අංක 34 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධන) නීතිවලින් සංශෝධිත 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතියේ 20 වැනි වගන්තිය යටතේ නිවේදනය**

ඉහත කී 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධිත) නීතියේ විධිවිධානයන් ක්‍රියාත්මක වීම හේතුවෙන් මේ සමග ඇති උපලේඛනයේ විස්තරාත්මක ලෙසින් දැක්වෙන නිවස/නිවාස මා වෙත පැවරී ඇති බැවින්,

එකී නීතියේ 20 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන ලද නිවාස මා වෙත සතු වූ දිනට පෙරාතුවම වූ දිනයෙහි එම නිවාසය හෝ නිවාස පිළිබඳ සම්බන්ධතාවයක් දැරූ සියලුම පුද්ගලයන් විසින් එම එක් එක් නිවාසය සඳහා සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසකට මෙම නීතිය යටතේ ගෙවිය යුතු මිළ පිළිබඳව ලිඛිත හිමිකම් පෑම මෙම ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කළ දිනයේ

සිට ලිත් මසක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් නියම කරමි. එම හිමිකම් පෑම් හි මතු සඳහන් කරුණු අන්තර්ගත විය යුතු යි.

(අ) ඔහුගේ/ඇයගේ නම සහ ලිපිනය ;
(ආ) එම නිවාසය පිළිබඳ වූ ඔහුගේ/ඇයගේ සම්බන්ධතාවයෙහි ස්වභාවය ;
(ඇ) ඔහුගේ/ඇයගේ හිමිකම් පෑමේ විස්තරය ;
(ඈ) ඔහු/ඇය එම මිලෙන් හිමිකම් කියන ප්‍රමාණය.

ජාතික නිවාස කොමසාරිස්.

2010 ජූලි මස 23 වැනි දින,
ඉදිකිරීම් ඉංජිනේරු සේවා,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

**උපලේඛනය**

| මගේ යොමු අංකය | ප්‍රකාශකයාගේ නම සහ ලිපිනය | වරිපනම් අංක සහ පිහිටීම | දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය බලමණ්ඩලය හා කොට්ඨාස අංකය | මානක සැලැස්ම | කැබලි අංක | පැවරෙන ප්‍රමාණය අ. | රූ. | පර්. | හෙක්. |
|---|---|---|---|---|---|---|---|---|---|
| CH/O/ 2580 | අයි. ඩබ්ලිව්. ඩබ්ලිව්. ඉන්ද්‍රතිස්ස මයා, අංක 125, ගල්වල පාර, දෙහිවල | 126/3, 126/3ඒ, 126/3බී ගල්වල පාර, දෙහිවල (වර්තමාන අංක අංක 15, 17 සහ 19, කුසලඥාන මාවත) | කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස ම. න. සභා සීමාව තුළ අංක 09, දෙහිවල නැගෙනහිර කොට්ඨාසය | කේ. ඩබ්ලිව්. ඩී. චන්ද්‍රානි බලයලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද 2010.05.25 දිනැති අංක 1684ඒ, සී.එච්./ඕ/25 80 දරන පිඹුර | ඒ, බී. සහ සී | - | - | 14.10 | 0.0357 |

08-145

---

**(175 වැනි අධිකාරය) වන්දනා ගමන් ආඥාපනත**

ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2010

ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ 2010 වාර්ෂික ඇසළ උත්සවය 2010.08.10 වැනි දින කප් පිටුවීමෙන් ආරම්භ වී 2010.08.25 වැනි දින අළුයම දිය කැපීමේ මංගල්‍යයෙන් නිමාවට පත් වන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව 1964 ජූලි මස 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනතාවගේ අවධානයට ලක් කරමි.

යූ. කේ. එස්. මිහිඳුකුලසූරිය,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති හා
ඌව වෙල්ලස්ස කොටබෝව කුඩා කතරගම දේවාලයේ,
ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී

2010 ජූලි මස 19 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2010**

1964 ජූලි මස 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ කොටබෝව වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

01. කඳවුරු ප්‍රදේශය :

කොටබෝවේ "දහමල් ඔය" නමැති පුරාණ තොටුපලේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භය ඇතුළත ප්‍රදේශය ඇතුළත් වේ.

02. ගොඩනැගිලි ඉදි කිරීම් :

මගෙන් හෝ මගේ බලයෙන් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිවෙකු විසින් හෝ 2010 අගෝස්තු මස 10 වැනි දින සිට 2010 අගෝස්තු මස 25 වැනි දින දක්වා කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ වෙළඳසැලක් ඉදි නොකළ යුතු ය.

03. යාචකයෝ :

පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනක දී යාචකයින් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද, කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදා දීම ද නොකළ යුතු ය.

04. නෑම සහ සේදීම ඃ

කොටබෝවේ "දහමල් ඔය" නමැති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විශ්කම්භය ඇතුළත ප්‍රදේශය තුළ කිසිවෙකු විසින් දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම හෝ වාහන සේදීම හෝ නොකළ යුතු ය.

05. වාහන ඃ

05.01 මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබා ගත් අවසරයක් රහිතව මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක් හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට (දහමල් ඔයෙන් නැගෙනහිරට) පැදවීම හෝ ඇතුළු කිරීම හෝ නොකළ යුතු ය.

05.02 කඳවුරට අයත් කඩබිම් ප්‍රදේශයේ වාහන නතර කිරීමට වෙන් කර ඇති රිය ගාල්වල හැර අන් කිසිදු ස්ථානයක වාහනයක් නතර කර නොතැබිය යුතු ය.

06. කාවාඩි කඩ ඃ

මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබා ගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවෙකු විසින් කාවාඩි කඩ පිහිටුවනු නොලැබිය යුතු ය.

07. වෙළඳාම

07.01. මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයකින් තොරව කඳවුරු භූමිය තුළ තාවකාලික කඩ බදු දීම හෝ වෙන්දේසි කිරීම නොකළ යුතුය. තවද මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ප්‍රදේශය තුළ නියම නොකරන ලද ස්ථානයක එවැනි කටයුතු සිදු කිරීම කිසිවකු විසින් නොකළ යුතුය.

07.02 පූජා පෙදෙස, මහී පාලමෙහි මාර්ගය හා කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුර අයුතු ලෙස ආක්‍රමණය කරන පරිදි යම් මඩුවක් තැනීම හෝ යම් ඉදි කිරීමක් කිරීම හෝ යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් විශාල කිරීමක් නොකළ යුතුය. එකී ප්‍රදේශයන්හි සංචාරක වෙළඳාම ද තහනම් ය.

07.03 මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙක් විසින් ඒ සඳහා අවසර දුන් ස්ථානය හැර කිසිවෙකු විසින් තින්නෝරු, අයිස්ක්‍රීම්, පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළඳාම් නොකළ යුතු ය.

07.04 යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් ගෙන යාමේ කාර්යය සඳහා සෑම ගොඩනැගිල්ලක, ඉදිකිරීමකම හෝ ස්ථානයක ප්‍රමාණයෙන් ඝන අඩි 04 1/2කට අඩු නොවන කුණු බාල්දියක් සපයා තිබිය යුතු ය. කුණු බාල්දියට කුණු කසළ දමන විට හා ඉන් ඒවා ඉවත් කරන විට හැර අන් සෑම විටම කුණු බාල්දිය පියනකින් වසා තැබිය යුතු ය. තවද සෞඛ්‍ය කම්කරුවන් විසින් කුණු ඉවත ගෙන යෑම සඳහා නියම කරනු ලැබූ වේලාවන්හිදී ඒ භාජන එම ස්ථානවල පිටතින් තැබිය යුතු ය.

07.05 විකිණීමට තබා ඇති සකස් කළ සියළු ආහාර ද්‍රව්‍ය හා පාන මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණ සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතු ය.

08. සනීපාරක්ෂාව සහ මහජන සෞඛ්‍ය ඃ

එම කාර්යය සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයකට හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් මළමූත්‍ර පහ නොකළ යුතු අතර, සලසා ඇති ස්ථානයක හෝ භාජනයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් දුව හෝ ඝණ කුණු කසල කිසිවක් නොදැමිය යුතුය.

මවිසින් දෙන ලද මෙම ආඥාවන් කිසිම තැනැත්තෙකු විසින් කඩ නොකළ යුතු ය.

08-96

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

### VII කොටස

**මොරටුව විශ්ව විද්‍යාලය**

***2009 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශන***

| | සටහන | 2009 රු. | 2009 රු. | 2008 රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපළ පිරියත් හා උපකරණ | 1 | | 1,63,11,41,435 | 1,12,10,52,450 |
| ආයෝජන (දීර්ඝ කාලීන) | 2 | | 7,00,18,204 | 3,81,64,037 |
| කෙරීගෙන යන වැඩ | 3 | | 26,50,07,216 | 69,55,35,695 |
| | | | 1,96,61,66,855 | 1,85,47,52,182 |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය | 4 | 1,11,61,361 | | 95,26,598 |
| සේවක ණය හා අත්තිකාරම් | 5 | 5,33,40,179 | | 4,88,13,397 |

| | සටහන | 2009 | 2009 | 2008 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| ලැබිය යුතු ආදායම් | 6 | 4,36,42,987 | | 4,86,00,878 |
| කලින් ගෙවීම් | | 98,32,638 | | 22,87,277 |
| බැංකු ශේෂය | 7 | 3,62,26,365 | | 2,47,81,178 |
| අතැති මුදල් | 8 | 921 | | 1,250 |
| | | | 15,42,10,451 | 13,40,10,578 |
| **මුළු වත්කම්** | | | 2,12,03,77,306 | 1,98,87,62,760 |
| *අඩු කළා : ජංගම වගකීම්* | | | | |
| ගෙවිය යුතු තැන්පත් | 9 | 1,38,20,340 | | 1,43,47,553 |
| පර්යේෂණ අරමුදල් | 10 | 1,26,75,613 | | 1,46,22,437 |
| ගෙවිය යුතු මුදල් | 11 | 4,01,17,384 | | 1,34,09,227 |
| උපචිත වියදම් | | 2,28,70,849 | | 1,99,37,074 |
| විලම්භිත ආදායම් | 12 | 13,45,53,600 | | 12,80,83,683 |
| පාරිතෝෂික ප්‍රතිපාදන වෙන් කිරීම් | | 7,13,15,096 | | 6,85,19,994 |
| පරණ භාණ්ඩ විකිණීමෙන් ලැබුණු ආදායම | | 19,25,181 | | 14,19,432 |
| | | | 29,72,78,063 | 26,03,39,400 |
| ශුද්ධ වත්කම්/ප්‍රාග්ධනය | | | 1,82,30,99,243 | 1,72,84,23,360 |
| මූලධන ආධාර - වැයවූ | 13 | | 1,55,68,44,331 | 1,46,11,08,967 |
| මූලධන ආධාර - වැය නොවූ | 14 | | | |
| මූලධන ආධාර උත්පාදිත | 15 | | 21,11,48,602 | 19,72,81,984 |
| ප්‍රදානයන් | 16 | | 89,88,03,845 | 89,21,67,447 |
| | | | 2,66,67,96,778 | 2,55,05,58,398 |
| **සංචිත** | | | | |
| ප්‍රත්‍යාගණන සංචිත | | 8,88,61,613 | | 8,88,61,613 |
| ක්‍රීඩා සංවර්ධන සංචිත | | 7,36,120 | | 5,23,120 |
| පොදු සංචිතය | | 1,12,75,40,254 | | (1,03,69,15,951) |
| | | | (1,03.79,42,521) | (94,75,31,218) |
| **අරමුදල** | | | | |
| සීමිත අරමුදල | 17 | 18,19,05,303 | | 11,76,14,142 |
| ප්‍රධාන අරමුදල | 18 | 1,23,39,684 | 19,42,44,987 | 77,82,038 |
| ශුද්ධ වත්කම්/ප්‍රාග්ධනය | | | 1,82,30,99,243 | 1,72,84,23,360 |

| ගිණුම් නිලධාරී (උපකුලපති) | සහකාර ගිණුම් නිලධාරී (ලේඛකාධිකාරී) | මුල්‍යාධිකාරී. |
|---|---|---|

**මොරටුව විශ්වවිද්‍යාලය**

2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය කාර්ය සාධනය

| | *සටහන* | *2009* | *2009* | *2008* |
|---|---|---|---|---|
| | | *රු.* | *රු.* | *රු.* |
| **ආදායම්** | | | | |
| රජයේ ප්‍රතිපාදන | | 71,79,00,000 | | 66,00,00,000 |
| ශිෂ්‍යාධාර | | 1,32,81,500 | | 1,63,20,900 |
| මහපොළ | | 61,39,350 | | 80,10,100 |
| ප්‍රදාන ශිෂ්‍යත්ව | | 1,10,200 | | 1,40,100 |
| ලැබුණු පොළී | 19 | 23,65,606 | | 21,37,759 |
| ශිෂ්‍යයන්ගෙන් ලද ආදායම් | 20 | 36,16,981 | | 26,94,703 |
| වෙනත් ආදායම් | 21 | 43,02,961 | | 44,14,637 |
| ප්‍රතිපාදන ලැබීම් පර්යේෂණ සඳහා | | 1,26,55,914 | | 97,10,541 |
| ක්‍රමක්ෂය | | 12,29,17,212 | | 9,51,83,321 |
| නේවාසිකාගාර ගිණුමේ අතිරික්තය | | 1,80,419 | | 2,85,078 |

| | සටහන | 2009 රු. | 2009 රු. | 2008 රු. | 2008 රු. |
|---|---|---|---|---|---|
| අඩුකළා : | | | | | |
| ව්‍යාපෘති ගිණුම් වලට මාරුකළ පර්යේෂන ප්‍රතිපාදන | | (1,26,55,914) | | (97,10,541) | |
| මුළු ආදායම | | | 87,08,14,229 | | 78,91,86,598 |
| වියදම් | | | | | |
| කාර්ය මණ්ඩල පාරිශ්‍රමිකය | 22 | 51,35,56,836 | | 46,45,22,282 | |
| ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 23 | 29,88,370 | | 36,22,537 | |
| සුභසාධක සේවා | 24 | 1,98,25,034 | | 1,76,04,480 | |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 25 | 1,93,09,300 | | 1,94,45,704 | |
| මුල්‍යාධාර ශිෂ්‍යයන් සඳහා | 26 | 2,03,12,600 | | 2,01,28,700 | |
| | | | 57,59,92,140 | | 52,53,23,703 |
| ගිවිසුම්ගත සේවා | 27 | 12,45,67,173 | | 10,49,68,224 | |
| සැපයුම් හා පාරිභෝගිත භාණ්ඩ | 28 | 6,29,11,018 | | 5,54,62,851 | |
| IRQUE ව්‍යාපෘතිය | | 34,91,221 | | 41,70,607 | |
| අධ්‍යයන පර්යේෂණ | | 1,77,50,423 | | 50,37,567 | |
| නඩත්තු කටයුතු | 29 | 1,61,13,512 | | 1,76,78,090 | |
| ක්ෂය කිරීම් | | 16,16,48,140 | | 21,05,72,886 | |
| | | | 38,64,81,487 | | 39,78,90,225 |
| | | | 96,24,73,627 | | 92,32,13,928 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබුණු අතිරික්තය (ඌණතාවය) | | | (9,16,59,399) | | (13,40,27,331) |
| මූල්‍ය වියදම් | 30 | | (18,05,718) | | (17,60,420) |
| කාලපරිච්ඡේදයට අනුව ශුද්ධ අතිරික්තය (ඌණතාවය) | | | (9,34,65,117) | | (13,57,87,751) |

ගිණුම් නිලධාරී (උපකුලපති) | සහකාර ගිණුම් නිලධාරී (ලේඛකාධිකාරී) | මුල්‍යාධිකාරී.

## මොරටුව විශ්වවිද්‍යාලය

2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රවාහය

| | සටහන | 2009 රු. | 2009 රු. | 2008 රු. | 2008 රු. |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුල්‍ය ප්‍රවාහ** | | | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්තය/(ඌණතාවය) | | (9,34,65,117) | | (13,57,87,751) | |
| වියදම් පියවා ගැනීමේ පාඨමාලා වල අතිරික්තය (ඌණතාවය) | | - | (9,34,65,117) | - | (13,57,87,751) |
| **ගැලපීම්** | | | | | |
| බැර ගැලපීම් (උප. 9+10) | | 98,45,275 | | 1,96,78,397 | |
| හර ගැලපීම් (උප. 11+12) | | (65,06,078) | | (5,51,18,027) | |
| ක්‍රීඩා ක්‍රියාකාරකම් | 17 | (2,13,000) | | - | |
| වත්කම් සඳහා ගැලපීම් | | - | | 1,53,581 | |
| ලැබූ පොළී | 19 | (23,65,606) | | (21,37,759) | |
| ක්ෂය ගැලපීම් | | (29,45,526) | | (33,41,535) | |
| පරිත්‍යාග සඳහා ගැලපීම් | | | | 30,941 | |
| බැංකු ගාස්තු | 30 | 18,05,718 | (3,79,217) | 17,60,420 | (3,89,73,982) |
| **මුල්‍ය නොවන සංචලන** | | | | | |
| ක්ෂය | 1 | 16,16,48,140 | | 21,05,72,886 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 1,52,61,633 | | 1,41.71,104 | |
| ක්‍රමක්ෂය | 1 | (12,29,17,212) | 5,39,92,561 | (9,51,83,321) | 12,95,60,669 |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ අතිරික්තය/ඌණතාවය | | | (3,98,51,772) | | (4,52,01,064) |

| | | සටහන | 2009<br>රු. | 2009<br>රු. | 2008<br>රු. | 2008<br>රු. |
|---|---|---|---|---|---|---|
| **කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම්/අඩුවීම්** | | | | | | |
| ජංගම වත්කම් වැඩිවීම් | (87,55,015) | | | | | |
| ජංගම වගකීම් වැඩිවීම | 3,34,93,320 | | 2,47,38,305 | | 3,53,42,585 | |
| පාරිතෝෂික ගෙවීම් | | 25 | 1,24,66,531 | | (1,52,01,472) | |
| සේවක ණය සහ අත්තිකාරම් පොළී | | 19 | 19,48,774 | 3,91,53,610 | 16.65,381 | 2,18,06,494 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | | | | (6,98,163) | | (2,33,94,570) |
| **අයෝජන ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රවාහ** | | | | | | |
| උපකරණ හා පිරියත් මිලදී ගැනීම් | | 1 | (12,08,30,854) | | (12,11,81,580) | |
| ඉදිකිරීම් සඳහා ගෙවීම් | | 3 | (11,83,24,738) | | (25,71,71,942) | |
| ප්‍රදාන අරමුදල්වලින් ලද බැංකු පොළිය | | 18 | 6,97,755 | | 4,87,842 | |
| අයෝජන පොළී | | 19 | 4,16,832 | (23,80,41,005) | 4,72,378 | (37,73,93,302) |
| අයෝජන ක්‍රියාකාරකම් සඳහා - ශුද්ධ මූල්‍ය ප්‍රකාශය | | | | (23,87,39,168) | | (40,07,87,872) |
| *මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රවාහ* | | | | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | | 14 | 14,98,50,887 | | 30,02,82,747 | |
| විශ්ව විද්‍යාල කොමිෂන් සභා ප්‍රතිපාදන | | 14 | - | | 30,00,000 | |
| පේෂ කර්මාන්ත අමාත්‍යාංශ ප්‍රතිපාදන | | 14 | - | | 27,35,000 | |
| වෙනත් ප්‍රාග්ධන ලැබීම් | | 14 | 12,91,374 | - | | |
| කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන | | 14 | 4,33,31,582 | | 1,50,00,000 | |
| ජාතික විද්‍යා සභා ප්‍රතිපාදන | | 14 | 2,47,350 | | 2,51,86,663 | |
| ජනිත කල ආදායම | | 15 | 1,38,66,618 | | 3,46,82,124 | |
| පරිත්‍යාග ලැබීම් | | 16 | 66,36,398 | | 14,23,031 | |
| අබලි භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම | | | 5,05,749 | | 4,94,477 | |
| ප්‍රධාන අරමුදල් සඳහා ගෙවීම් | | 18 | (11,88,750) | | 4,96,700) | |
| ප්‍රධාන අරමුදල්වලින් ලැබීම් | | 18 | 50,48,641 | | 7,39,000 | |
| සීමිත අරමුදල් වැඩිවීම | | | 6,42,91,161 | | 4,09,18,609 | |
| ගෙවූ බැංකු ගාස්තු | | 30 | (18,05,718) | | 17,60,420 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | | | | 28,20,75,291 | | 42,22,04,531 |
| මුදල් හා මුදලට අදේශනවල/ශුද්ධ වැඩිවීම් (අඩුවීම) | | | | 4,33,36,123 | | 2,14,16,659 |
| මුදල් හා මුදලට අදේශන - ආරම්භක ශේෂය | | 31 | | 6,29,46,465 | | 4,15,29,806 |
| මුදල් හා මුදලට අදේශන - අවසන් ශේෂය | | 31 | | 10,62,82,588 | | 6,29,46,465 |

මූල්‍යාධිකාරී

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

මගේ අංකය : සීඊ/ඩී/යූඑම්/එෆ්එස්/2009

2010 ජුනි මස 09 වැනි දින.

උප කුලපති,
මොරටුව විශ්ව විද්‍යාලය

**මොරටුව විශ්ව විද්‍යාලයේ 2009 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

මොරටුව විශ්ව විද්‍යාලයේ 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) සහ III වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධිවිධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවක් 2010 මාර්තු මස 15 වැනි දින උපකුලපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන ලද බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වැනි වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මොරටුව විශ්ව විද්‍යාලයේ 2009 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම් හැර, 2009 දෙසැම්බර් මස 31 දිනට මොරටුව විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත්, මා දරන්නා වූ මතය වේ.

2.1.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1.2 ගණකාධිකරණ අඩුපාඩු

(අ) වර්ෂ 01 සිට 05 දක්වා කාලයකට පෙර නිමකර තිබූ කෙටිකාලීන පාඨමාලා 37කට අදාල රු. 40,93,948ක් වූ අතිරික්තයක් ද, වර්ෂ 06කට පෙර නිමකර තිබූ පුහුණු වැඩමුළු 02කට අදාළ රු. 2,56,248ක අතිරික්තයක් ද, වර්ෂ 05කට පෙර නිමකර තිබූ ව්‍යාපෘති 02කට අදාල රු. 4,98,265ක අතිරික්තයක් ද, වර්ෂ 03කට පෙර නිමකර තිබූ පශ්චාත් උපාධි පාඨමාලා 01ක අතිරික්තය වූ රු. 27,950ක් ද, ඒ ඒ වර්ෂවල ආදායමට බැර කරනු වෙනුවට විලම්භිත ආදායම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) ජංගම බැරකම් යටතේ පෙන්වා ඇති වර්ෂ 04ක් ඉක්ම වූ පුස්තකාල ගාස්තු රු. 16,76,400ක් හා වර්ෂ 03 ඉක්ම වූ සේවකයින් 08 දෙනෙකු විසින් ඉල්ලුම් නොකළ රු. 1,25,590ක වැටුප් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගොඩනැගිලිවලට වූ අලාභහානි වෙනුවෙන් ශිෂ්‍යයින්ගෙන් 2007 වර්ෂයේ දී අයකර ගෙන තිබූ රු. 23,52,975ක් ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට බැරකම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

2.1.3 නොසැසඳූ ගිණුම්

“උපදේශක සේවා සංචිත අරමුදල් ” ගිණුමේ ශේෂය රු. 3,98,31,561ක් වූ ද, ඊට අනුරූපීව පවත්වාගෙන යනු ලබන ආයෝජන ගිණුමේ පැවැති රු. 54,44,252ක් හා බැංකු ජංගම ගිණුමේ පැවැති රු. 3,42,49,665ක් වශයෙන් එහි එකතුව ලෙස රු. 3,96,93,917ක් වූ බැවින් සංචිත ගිණුම හා ආයෝජන ගිණුම අතර රු. 1,37,644ක වෙනසක් නිරීක්ෂණය විය.

2.1.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩලයේ 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 12,453ක මාණ්ඩලික ණය ශේෂ ද, කාර්ය මණ්ඩලයේ 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 48,649ක වාහන ණය ශේෂය ද, 1980 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි ;

(ආ) 2003 වර්ෂයේ දී ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත රු. 44,35,700ක් ලබාදී තිබුණ ද, එම දෙපාර්තමේන්තුව විසින් එම කාර්යය ඉටු නොකරන ලද බැවින් එම මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි ;

(ඇ) වර්ෂයක් ඉක්ම වූ රු. 1,49,917ක ණයහිමි ශේෂ 06ක් නිරවුල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි ;

(ඈ) විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ ශේෂයක් නොතිබුණු, නිලධාරීන් පස්දෙනෙකුගෙන් අයවීමට තිබූ රු. 79,85,292ක ගිවිසුම් කඩකිරීම් ද, රු. 2,03,235ක ණය මුදල් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉන් එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 19,27,200ක මුදල වර්ෂ 15කට වඩා පැරණි වූවකි ;

(ඉ) ගිවිසුම් හා බැඳුම්කර කඩකළ නිලධාරීන් 23 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 96,01,131ක් වූ ගිවිසුම් කඩකිරීමේ වන්දි හා ණය මුදල් රු. 52,87,409ක් වූ ඔවුන්ගේ විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට හා ඉතිරිය ඔවුන්ගෙන් පෞද්ගලිකව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි ;

(ඊ) දිගු කලක සිට ආයතන 08ක තැන්පත් කර තිබූ කල් ඉකුත් වූ රු. 42,330ක තැන්පතු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.1.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය :

| *නීති-රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| (I) x පරිච්ඡේදයේ 23 වගන්තිය | ආචාර්යවරුන්ට දෙනු ලබන නිවාඩු පිළිබඳ ලේඛන පවත්වා නොතිබුණි. |
| (II) ix පරිච්ඡේදයේ 4.3 වගන්තිය | අතිකාල සඳහා පැමිණීමේ හා පිටවීමේ ලේඛනයන් තබාගත යුතු වුව ද, විශ්වවිද්‍යාලයේ අතිකාල ගෙවීම් සඳහා එවැනි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.2 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා නේවාසිකාගාරය ඇතුළු විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය හා ක්‍රමක්ෂය ගණන් ගැනීමට පෙර රු. 93,42,82,329ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 89,09,71,072ක් විය. කෙසේ වුව ද, සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු. 71,79,00,000ක් වූ රජයේ ප්‍රදානය හා රු. 12,29,17,212ක ක්‍රමක්ෂය හේතුකොටගෙන එම ඌනතාවය රු. 9,34,65,117ක් දක්වා අඩු වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු. 66,00,00,000ක් වූ රජයේ ප්‍රදානය හා රු. 9,51,83,321ක් වූ ක්‍රමක්ෂය හේතුකොටගෙන එම ඌනතාවය රු. 13,57,87,751ක් දක්වා අඩුවී තිබුණි.

3.2. මෙහෙයුම් සමාලෝචනය

3.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(අ) වාහන ධාවනය පාලනය කිරීම සඳහා අත්‍යවශ්‍ය ගේට්ටු අවසරපත් භාවිතා කර නොතිබුණි ;

(ආ) රු. 29,60,000ක් වූ රජයේ ප්‍රතිපාදනවලින් සිදුකරනු ලැබූ පර්යේෂණ 12ක් නිමකළ යුතු කාලය 2009 ඔක්තෝබර් වන විට මාස 07 සිට අවුරුදු 2 1/2ක කාල පරාසයක් තුළ ප්‍රමාද වෙමින් පැවතුණි.

3.2.2 නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(අ) විදේශ මුදල් බැංකු ගිණුමේ රු. 3,57,275ක ශේෂය 2006 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි ;

(ආ) ආසියානු සංවර්ධන බැංකු ශිෂ්‍යත්ව අරමුදල් ගිණුමේ රු. 9,38,701ක ශේෂය 2007 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි ;

(ඇ) උපදේශන සේවා අරමුදලේ වූ රු. 3,42,49,665ක් ජංගම ගිණුමක රඳවා තිබූ අතර එම මුදල් ආයෝජනය කර පොළී ආදායමක් උපයා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

3.2.3 කාර්ය සාධනය

(අ) සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය තුළ ස්ථිර කථිකාචාර්යවරු 35ක් ද, කොන්ත්‍රාත් හා බාහිර කථිකාචාර්යවරු 117ක් ද සේවයේ යෙදී සිටියහ.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍ය තොරතුරු පහත පරිදි විය.

| | *ඉංජිනේරු පීඨය* | *තොරතුරු තාක්ෂණ පීඨය* | *වාස්තු විද්‍යා පීඨය* |
|---|---|---|---|
| බඳවාගත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | 787 | 104 | 296 |
| පිටවූ උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | 631 | 106 | 300 |
| රැඳී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 3,026 | 357 | 1,190 |

(i) සමාලෝචිත වර්ෂයේ සේවයේ නියුක්තව සිටි ස්ථිර කථිකාචාර්යවරු සංඛ්‍යාව 263ක් වූ අතර එක් කථිකාචාර්යවරයෙකු සඳහා වූ සාමාන්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 17ක් විය ;

(ii) සමාලෝචිත වර්ෂය තුළ මහපොළ ශිෂ්‍යත්ව ආධාර වශයෙන් ශිෂ්‍යයින් 1257කට රු. 63,50,200ක් ගෙවා තිබූ අතර ශිෂ්‍යාධාර වශයෙන් ශිෂ්‍යයන් 2,258කට රු. 13,890,200ක් ගෙවා තිබුණි ;

(iii) සමාලෝචිත වර්ෂයේ ක්ෂය කිරීම් හැර පුනරාවර්තන වියදම රු. 80,26,31,205ක් වීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය රු. 1,75,515ක් වී තිබුණි ;

(iv) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයින් 939කට හා ශිෂ්‍යාවන් 234කට නේවාසිකාගාර පහසුකම් සලසා තිබූ අතර නේවාසික වියදම රු. 6,20,676ක් වී තිබුණි.

3.2.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලනකාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයෙන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය :-

(අ) අත්තිකාරම් ගෙවීම හා පියවීම ;
(ආ) පශ්චාත් උපාධි පාඨමාලා ආදායම් ;
(ඇ) ස්ථාවර වත්කම් ;
(ඈ) නඩත්තු වියදම් ;
(ඉ) මිලට ගැනුම් ;
(ඊ) ගිවිසුම් කඩකිරීම් ;
(උ) පර්යේෂණ.

එස්. ස්වර්ණජෝති,
විගණකාධිපති.

08-21

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නොච්චියාගම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

පුංචි බණ්ඩාගේ දිසානායක සහ මුදියන්සේගේ අභයසිංහ.

2010.06.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩී. ඒ. දිසානායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2006.02.22 දින සහ අංක 4136, 2007.04.25 දින අංක 4877 සහ 2008.09.05 දින අංක 5494 දරන උකස් බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පුංචි බණ්ඩාගේ දිසානායක සහ මුදියන්සේගේ අභයසිංහ යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් අටලක්ෂ පනස්එක්දහස් දෙසිය දහතුනයි ශත හතලිස්හත (රු. 8,51,213.47) ක මුදලක් 2010.02.23 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 8,51,213.47ක මුදලට 2010.02.24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4136, 4877 සහ 5494 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, නොච්චියාගම කොට්ඨාස කාර්යාලයේ විලච්චිය කෝරළේ, ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 350ට අයත් මානෙල්වැව ගමෙහි පිහිටි ඉඩමට බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක ඒ133 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 223" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 226න් ද, නැගෙනහිරට : ලොට් 224 සහ 226 න් ද, දකුණට : ලොට් 222, 221 සහ 224න් ද, සහ බස්නාහිරට : ලොට් 222 සහ 224න් ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි දෙකයි බිංදුව (හෙක්. 0.220) විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්, පත්‍රිරු එල්. ඩී. ඕ 584/177හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක ටී. බී. ආරියසේන විසින් මැන සාදන ලද 2006.01.21 දින අංක 2123 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : එෆ්. සී. පී. ඒ. 133ට අයත් ලොට් 204 (පාර) සහ 226න් ද, නැගෙනහිරට : එෆ්. සී. පී. ඒ 133ට අයත් ලොට් 224 සහ 226න් ද, දකුණට : එෆ්. සී. පී. ඒ 133ට අයත් ලොට් 222, 221 සහ 224න් ද සහ බස්නාහිරට : එෆ්. සී. පී. ඒ. 133ට අයත් ලොට් 202, 204 (පාර) න් ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි දෙකයි බිංදුව (හෙක්. 0.220) හෝ රූඩ් දෙකයි පර්චස් බිංදුවයි හත (අ. 0, රූ. 2, පර්. 07)ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග පිහිටි ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-154/4

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හෙට්ටිවීදිය ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මුතුකුට්ටි කුබේරලිංගම්.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ ද, 1997.12.17 දිනැති සහ අංක 1167 දරන උකස් බැඳුම්කරය යටතේ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2000.12.22, 2003.08.26, 2005.05.31 සහ 2006.06.05 දිනැති සහ පිළිවෙලින් අංක 652, 964, 1514 සහ 1848 දරන බැඳුම්කර යටතේ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2007.10.31 දිනැති සහ අංක 3002 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුතුකට්ටි කුබේරලිංගම් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පනස්පන්ලක්ෂ පනස්තුන්දහස් හාරසිය දහහතරයි ශත තිස්හත (රු. 55,53,414.37) ක මුදලක් 2010.04.05 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 55,53,414.37ක මුදලට 2010.04.06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද, තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1167, 652, 964, 1514, 1848 සහ 3002 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කෙලාර්ට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාවේ, කොටහේන නැගෙනහිර, වසම් අංක 7 දරන කොටහේන පිහිටි මේෆිල්ඩ් පටුමගේ, වරිපනම් අංක 127/4 දරන නුගගහකුඹුර සහ මදන්ගහකුඹුර නමැති ඉඩමට බලයලත් මානක එම්. බී. ද සිල්වා විසින් පිළියෙල කරන ලද 1953.10.12 දිනැති අංක 8305 දරන පිඹුරෙන් බෙදාවෙන් කළ ලොට් ඩී නමැති ඉඩම් කොටසට මායිම්, ඊසාන දිගට : ලොට් ඊ වලින් ද, නැගෙනහිරට : වෙන් කර ඇති පාරෙන් ද, නිරිතදිගට : ලොට් සී වලින් ද, සහ වයඹට : එම ඉඩමේම කොටසකින් සහ ටී. පෙමියානෝ ප්‍රනාන්දුට අයිති ලොට් සී වලින් ද මායිම් වූ පර්චස් අටයි දශම දෙකයි අට (අ. 0, රූ. 0, පර්. 8.28)ක් විශාල ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග වේ. මෙම ඉඩම කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 759/292 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති).

08-154/5

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හෙට්ටිවීදිය ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මුතුකුට්ටි කුබේරලිංගම්.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ ද 2009.06.25 දින සහ අංක 657 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුතුකුට්ටි කුබේරලිංගම් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑහත්ලක්ෂ හැත්තෑඅටදහස් හයසිය අටයි ශත දහහතර (රු. 77,78,608.14) ක මුදලක් 2010.04.05 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 77,78,608.14ක මුදලට 2010.04.06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 657 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කෙලාර්ට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (නමුත් කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) අලුත්කුරු කෝරල, දකුණ අධිකාරි පත්තුවේ, වත්තල-මාබෝලේ නාගරික සභා සීමාව තුළ වසම් අංක 4හි තෙලගපාත ගමේ පිහිටි තෙලගපාත මාවතේ, වරිපනම් අංක 103/13ඩී දරන ගොරකගහකුඹුර නමැති ඉඩමට බලයලත් මානක එච්. ඩොනල්ඩ් විසින් පිළියෙල කරන ලද 1989.01.28 දිනැති අංක 364 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 2ඒ නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස වන දැන් බී. ආරියදාසට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : ගොරකගහකුඹුර නොහොත් පිටවල දැන් සියරට මුදලාලිට අයිති ඉඩමෙන් ද, දකුණට : වරිපනම් අංක 103/4 දරන ලොට් 2බී වන දැන් ටී. එච්. ඉනෝහාමිට අයිති ඉඩමෙන් ද, සහ බටහිරට : ලොට් 2සී (අඩි 10ක් පළල පාර) න් ද මායිම් වූ එකී අංක 364 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහ (අ. 0, රූ. 0, පර්. 12)ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් සමග වේ. මෙම ඉඩම කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 983/145 යටතේ ලියාපදිංචි වී ඇත.

එකී අංක 657 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-154/6

---

### මහජන බැංකුව - කටුනායක ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධික 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.04.29 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2006.08.17 දිනැති අංක 3545 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කොහිලවත්ත කංකානමලාගේ විමලා කාන්ති සහ රණසිංහ ආරච්චිලාගේ රෙජිනෝල්ඩ් ප්‍රේමන් ජෝශප් රණසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ තිස්හත් දහස් අසූවයි ශත හතලිස් පහ (රු. 3,37,080.45) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.11.26 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් තුන්ලක්ෂ තිස්හත් දහස් අසූවයි ශත හතලිස් පහක (රු. 3,37,080.45) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීම්ක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ තිස්හත් දහස් අසූවයි ශත හතලිස් පහ (රු. 3,37,080.45)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත්, ඩලස් කෙලාට්ස් වෙන්දේසිකාර (පුද්ගලික) සමාගම විසින් එකී අංක 3545 දරන

උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ කටාන උප දිසාපති කොට්ඨාසයේ කිඹුලපිටිය ගමේ පිහිටි ඉද්දගොඩැල්ල ඉඩමට බලයලත් මානක ඩබ්. ඩී. එන්. සෙනෙවිරත්න මහතා විසින් මැන සාදන ලද අංක 917 දරන 1990.12.09 දිනැති පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 02 දරන කොටස ද, දකුණු-නැගෙනහිරට : ගම්සභා පාර ද, දකුණු-බස්නාහිරට : පාර ද, උතුරු-බස්නාහිරට : එල්. පී. සමරසේන අප්පුහාමිට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසි දෙකයි දශම එකයි හත (අ. 0, රූ. 1, පර්. 22.17)ක් විශාල ඉඩම් කොටස සහ ඒ මත පිහිටි ගහකොල, පළතුරු සියළු දේද සමගින් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක මීග/කටා/10/54 හි ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටස් හි මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
ගම්පහ,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

08-110

---

### මහජන බැංකුව - කටුනායක ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2009.04.02 දිනැති අංක 14485 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, අලහකෝන් ආරච්චිගේ සුනන්දා අලහකෝන් හෙවත් සුනන්දා අලහකෝන් හෙවත් විජිතා සහ තම්මිටගේ චම්පා ප්‍රියංගනී ජයවර්ධන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හයලක්ෂ තුන්දහස් තුන්සිය තිස් තුනයි ශත තිස් අට (රු. 6,03,333.38) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2010.01.08 දින සිට වර්ෂයකට 27% බැගින් රුපියල් හයලක්ෂ තුන්දහස් තුන්සිය තිස් තුනයි ශත තිස් අට (රු. 6,03,333.38) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා ඒවා අඩුව එකී රුපියල් හයලක්ෂ තුන්දහස් තුන්සිය තිස් තුනයි ශත තිස් අට (රු. 6,03,333.38)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාර්ට්ස් (පුද්ගලික) සමාගම විසින් එකී අංක 14485 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

මෙම දේපළ මත ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2009.04.02 දිනැති අංක 14487 දරන උකස්කරය යටතේ ලබාගත් රු. 2,00,000ක ක්‍රමික ණය මුදලක් පවතී.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභාවේ කෝවින්න ග්‍රාමයේ පලුගහවත්ත හෙවත් රික්ගහවත්ත සහ හික්ගහවත්ත යන ඉඩමට බලයලත් මානක ආර්. අයි. ප්‍රනාන්දු මහතා විසින් මැන සාදන ලද අංක 4638 දරන 1997.04.30 දිනැති පිඹුර ප්‍රකාර ලොට් අංක 02 දරන කොටසට මායිම්, උතුරට : එම්. ඒ. විල්බට් මාවත, නැගෙනහිරට : ටී. ජී. අප්පුහාමිට අයිති ඉඩම ද, දකුණට : කැබලි අංක 03, බස්නාහිරට : කැබලි අංක 01 යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 14.5)ක් විශාල ඉඩම් කොටස සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු, සියළු දේ ද සමගින් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක සී 797/207හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
ගම්පහ,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,

08-112

---

### මහජන බැංකුව - කටුනායක ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2004.06.23 දිනැති අංක 1427 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් සමිත චන්ද්‍රික ලොකුරාළලාගේ යන අය විසින් පැහැර හැර ඇති බැවින්

ද, එකී අංක 1427 දරන උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ හතලිස් අටදහස් හාරසිය විසිපහයි ශත තුන (රු. 3,48,425.03) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.06.24 දින සිට වර්ෂයකට 15.75% බැගින් රුපියල් තුන්ලක්ෂ හතලිස් අට දහස් හාරසිය විසිපහයි ශත තුනක් (රු. 3,48,425.03) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි ගාස්තු සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ හතලිස් අටදහස් හාරසිය විසිපහයි ශත තුන (රු. 3,48,425.03)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලොව්ස් වෙන්දේසිකාර පුද්ගලික සමාගම විසින් එකී අංක 1427 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කරය ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, උතුරු අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, සීදූව කටුනායක නගර සභා සීමාව තුළ වරිපනම් අංක 225, 225/1 සහ 225/2 බේස්ලයින් පාර, අමන්දොළුව පිහිටි කීනගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. ජේ. වී. පෙරේරා මහතා විසින් 1986.10.04 දින සාදන ලද පිඹුරු අංක 9263 පිඹුරට අනුව ලොට් අංක 03ට මායිම්, උතුරට : තෝමස් පෙරේරාට අයත්ව තිබුණු දැනට කේ. ඊ. පෙරේරාට අයත් දේපළ, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් අංක 04, දකුණට : පාර, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 02 යන මායිම් තුළ පිහිටි පර්චස් තිහයි දශම තුනයි හතයි පහ (අ. 0, රූ. 0, පර්. 30.375)ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 735/202 හි ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ සඳහන් මාර්ගයන්හි මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
ගම්පහ,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-111

---

### මහජන බැංකුව - ඉමදූව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන
මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී(29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.22 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් මහගමගේ චූලාංගනී අරෝෂිනී විසින් 2007.01.12 දින ලියා සහතික කරන ලද අංක 1716 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රනේපුර හේවගේ කරුණාතිලක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ අනූහයදහස් හැත්තෑවයි ශත හතලිස් තුනක (රු. 2,96,070.43) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.02.16 දින සිට වර්ෂයකට 19.5% බැගින් රුපියල් දෙලක්ෂ අනූහයදහස් හැත්තෑවයි ශත හතලිස් තුනක් (රු. 2,96,070.43) සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ අනූහයදහස් හැත්තෑවයි ශත හතලිස් තුනක (රු. 2,96,070.43) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 1716 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අගුළුගහ පිහිටි දියතාලියගහවත්ත හෙවත් විලේගොඩකන්ද, හෙවත් පරගහවත්ත ඉඩමට බලයලත් මානක ෂෙල්ටන් පීරිස් මහතා විසින් මැන සම්පාදිත අංක 1924 හා 2004.12.23 දින දරන පිඹුර ප්‍රකාර ලොට් 2 දරන කැබැල්ලට මායිම්, උතුරට : මහකුඹුර ද, නැගෙනහිරට : මහ පාරේ සිට ගෙවල්වලට යන පාර ද, දකුණට : මෙම ඉඩමේ අංක 4 පාර සඳහා වෙන් කළ බිම ද, බස්නාහිරට : මෙම ඉඩමේ අංක 1 දරන කැබැල්ල ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තුනයි දශම දෙක (අ. 0, රූ. 1, පර්. 3.2)ක් විශාල ඉඩමේ බිම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම් කැබැල්ල ඩී 897/143 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලේඛනගතවී ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අගුළුගහ පිහිටි දියතාලියගහවත්ත හෙවත් විලේගොඩකන්ද හෙවත් පරගහවත්ත ඉඩමට බලයලත් මානක ෂෙල්ටන් පීරිස් මහතා විසින් මැන සම්පාදිත අංක 1924 හා 200412.23 දින දරන පිඹුර ප්‍රකාර ලොට් 3 දරන කැබැල්ලට මායිම්, උතුරට : මහ කුඹුර ද, නැගෙනහිරට : ඇල ද, දකුණට : මෙම ඉඩමේ අංක 8 දරන කැබැල්ල ද, බස්නාහිරට : මහ පාරේ සිට ගෙවල් වලට යන පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහසයයි දශම හතර (අ. 0, රූ. 0, පර්. 16.4)ක් විශාල ඉඩමේ බිම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම් කැබැල්ල ඩී 897/144 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලේඛනගතවී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහල ඩික්සන් පාර,
ගාල්ල.

08-105

**මහජන බැංකුව - දෙහිවල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය, විසින් සහතික කරන ලද අංක 1088 සහ 2003.09.15 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, කුඩාතන්තිරිගේ අසේල චමල් කිත්සිරි මයා සහ පැලැන්දහේවගේ මෙලනී රෝෂිකා ද සිල්වා මහත්මිය විසින් පැහැර හැර ඇති හෙයින් දැන් එකී අංක 1088 දරන බැඳුම්කරය මත රුපියල් හයලක්ෂ විසිදහස් හත්සිය විසිපහයි ශත හැට නවයක (රු. 6,20,725.69) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් හයලක්ෂ විසිදහස් හත්සිය විසිපහයි ශත හැට නවයක (රු. 6,20,725.60) එකී මුදල ද 2009.05.15 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හයලක්ෂ විසිදහස් හත්සිය විසිපහයි ශත හැට නවයක (රු. 6,20,725.69) මුදලක් මත වර්ෂයට සියයට දහඅටක් (18%) බැගින් තවදුරටත් පොළිය ද, විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකරගත යුතු වෙනත් මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 1088 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ මාවිත්තර පිහිටියා වූ ද, සම්බුද්ධි කටහගහ වත්ත යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. ඒ. එස්. ඒ. ගුණසේකර මහතා විසින් සාදන ලද අංක 589 හා 1999.08.15 දින දරන මිණුම් පිඹුරේ ලොට් අංක බී6 ලෙස ලකුණුකොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : (පාර සඳහා වෙන් කිරීම වන) ලොට් බී8 ද, නැගෙනහිරට : ලොට් අංක බී7 ද, දකුණට : පටු පාර ද, බස්නාහිරට : ලොට් අංක බී5 ද මායිම් වන්නා වූ ද පර්චස් නවයක් (අ. 0, රූ. 0, පර්. 9) විශාල වූ බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත් ය.

ඉහත කී අංක 589 දරන පිඹුරේ ලොට් බී8, (අඩි 10-12 පළල පාරක් සඳහා වෙන් කිරීමවන) ලොට් බී4 සහ අඩි පාර උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ.

නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2656/153 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාප II.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත),
අංක 102,
ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

08-107

---

**හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - බලංගොඩ ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මග්ගෝන ගුරුන්නාන්සේලාගේ උපුල් සන්ධ්‍යා ප්‍රනාන්දු.

2010.06.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. කොස්ගොඩගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2005.02.09 දිනැති අංක 455 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මග්ගෝන ගුරුන්නාන්සේලාගේ උපුල් සන්ධ්‍යා ප්‍රනාන්දු යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතලිස්දහස් දෙසිය දහයයි ශත දොළහ (රු. 1,40,210.12) ක මුදලක් 2009.09.30 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,40,210.12ක මුදලට 2009.10.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 455 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ, හෙලඋඩ පත්තුවේ, බලංගොඩ නාගරික සභා සීමාවේ, බලංගොඩ, රාස්සගල පාරේ වරිපනම් අංක 76/49 බෝගහහේනේ කොටස නමැති ඉඩමට බලයලත් මානක කේ. නන්දසේන විසින් මැන සාදන ලද 1992.01.24 දිනැති අංක 306හි ලොට් 13 නමැති කොටසට මායිම්, උතුරට : ලොට් අංක 8 (පාර)න් ද, නැගෙනහිරට : ලොට් 14න් ද, දකුණට : ලොට් 17 (පාර)න් ද සහ බස්නාහිරට : ලොට් 14 වඩාත් නිවැරදිව ලොට් 12න් ද මායිම් වූ පර්චස් අටයි දශම තුනයි හතර (අ. 0, රූ. 0, පර්. 8.34) ක් විශාල ඉඩම සමග එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේත් සමග වන මෙය රත්නපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 273/247 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක ඊ. ටී. පී. පෙරේරා විසින් නැවත මැන සාදන ලද 2004.12.06 දිනැති අංක 1800 දරන පිඹුර ප්‍රකාර පහත පරිදි විස්තර කෙරේ.

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ, හෙලඋඩ පත්තුවේ, බලංගොඩ නාගරික සභා සීමාවේ, බලංගොඩ, රාස්සගල පාරේ වරිපනම් අංක 76/49 බෝගහහේනේ නමැති පිඹුරු අංක 1800හි ලොට් 1 නමැති කොටසට මායිම්වන උතුරට : බලයලත් මානක කේ. නන්දසේන විසින් මැන සාදන ලද පිඹුරු අංක 306හි ලොට් අංක 8 (යූ. සී. පාර)න් ද, නැගෙනහිරට : බලයලත් මානක කේ. නන්දසේන විසින් මැන සාදන ලද පිඹුරු අංක 306හි ලොට් අංක 14න් ද, දකුණට : බලයලත් මානක කේ. නන්දසේන විසින් මැන සාදන ලද පිඹුරු අංක 306හි ලොට් 17න් ද සහ බස්නාහිරට : බලයලත් මානක කේ. නන්දසේන විසින් මැන සාදන ලද පිඹුරු අංක 306හි ලොට් අංක 12න් ද මායිම් වූ පර්චස් අටයි දශම තුන (අ. 0, රූ. 0, පර්. 8.3) ක් විශාල ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-154/2

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඕ. ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2008.04.21 දිනැති අංක 1828 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නලින් ජීවන්ත විමලවීර යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්හත්ලක්ෂ තිස්නමදහස් හාරසිය අසූතුනයි ශත හැටහත (රු. 57,39,483.67) ක මුදලක් 2009.12.10 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 57,39,483.67ක මුදලට 2009.12.11 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1828 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩලස් කෙලාර්ට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කරන්දෙණිය කිරිපැද්ද පිහිටි ''දන්ගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මානක එම්. ජී. රංජිත් ආනන්ද විසින් මැන සාදන ලද 2008.02.02 දිනැති අංක 2060ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් 43 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් 41න් ද, නැගෙනහිරට : ලොට් 44න් ද, දකුණට : යක්කඩුව-කිරිපැද්ද ප්‍රධාන මාර්ගයෙන් ද සහ බටහිරට : ලොට් 42න් ද මායිම් වූ පර්චස් දහතුන (අ. 0, රූ. 0, පර්. 13)ක් විශාල ඉඩම ගොඩනැගිලි ගහකොළ සහ සියලු දේත් සමග වේ. මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 271/193 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-154/1

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අම්බලන්ගොඩ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

නලින් ජීවන්ත විමලවීර.

2010.06.03 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

---

### සෙලාන් බැංකුව පීඑල්සී - උපාධිධාරී ව්‍යවසායකත්ව ණය ශාඛාව
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.08 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය

කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0770-01447274-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් කේ. කේ. ඩබ්ලිව්. වාමරසිංහ විසින් සහතික කරන ලද 2004 මාර්තු මස 10 දිනැති අංක 467, ප්‍රසිද්ධ නොතාරිස් සන්ධ්‍යා තෙපුලන්ගොඩ විසින් සහතික කරන ලද 2005 ජූලි මස 18 දිනැති අංක 825 සහ ප්‍රසිද්ධ නොතාරිස් විරාජ් වික්‍රමරත්න විසින් සහතික කරන ලද 2006 ජනවාරි මස 09 වැනි දිනැති අංක 37 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම කැකිරාව, දඹුලුහල්මිල්ලෑව උල්පත්යාය පදිංචි කලල්පිටිය රාජපක්ෂලාගේ අසංක සංජය බණ්ඩාර රාජපක්ෂ සහ කලල්පිටිය රාජපක්ෂලාගේ සිරිසේන රාජපක්ෂ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ දහදහස් දෙසිය තිස් නවයයි ශත හැටඑකක (රු. 5,10,239.61) සහ රුපියල් එක්ලක්ෂ විසිදහස් තුන්සිය විසිහයයි ශත දොළහක (රු. 1,20,326.12) මුදලක්, 2009 මැයි මස 25 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 6,30,565.73ක මුදල ද, 2009 මැයි මස 26 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට දහනවය (19%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 467, 825 සහ 37 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලාගල ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ පත්තු නොහොත් කෝරළේ, දකුණු පලාගම් පළාතේ 666 නාරංගස්වැව ග්‍රා. සේ. කොට්ඨාසයේ උල්පොත්යාය ගමේ පිහිටි 1996.02.28 දිනැති අංක අනු/පල/ප්‍ර/185 දරන ප්‍රදානයේ ද සඳහන් අංක 1124 (665/1124) දරන සැලැස්මේ විස්තර කරනු ලබන රජයේ ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : කේ්/ඒ/125/132 (නොහොත් එන්ජ්/ඒ125/132) සහ බස්නාහිරට : කේඉ/ඒ14 (නොහොත් එන්ජ්/ඒ14) යන මායිම් තුළ හෙක්ටයාර් එකයි දශම දෙකයි නවයක් (හෙක්ටයාර් 1.29) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මෙම ඉඩම පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර කර ඇත :

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලාගල ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ පත්තු නොහොත් කෝරළේ, දකුණු පලාගම් පළාතේ 666 නාරංගස්වැව ග්‍රා. සේ. කොට්ඨාසයේ උල්පොතයාය පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කේ. චින්නයියා විසින් සාදන ලද 2003.11.29 දිනැති අංක 262 දරන සැලැස්මේ ලොට් 1 ලෙස සහ 1996.02.28 දිනැති අංක අනු/පල/ප්‍ර/185 දරන ප්‍රදානයෙහි සහ අංක 1124(665/1124) දරන අවසාන ග්‍රාම සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 2හි කොටසක නැවත මැනීමක් වන ගොඩ ඉඩම නමැති රජයේ ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර දිගේ වෙන් කිරීම (පී. එස්.) ද, නැගෙනහිරට : පාර දිගේ වෙන් කිරීම (පී. එස්.) ද, දකුණට : බී. ඕ. ඩී. 1124හි සඳහන් ලොට් 125/132(665/1124) සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ අක්කර තුනයි, පර්චස් තිහක් (අ. 3, රූ. 0, පර්. 30) නොහොත් හෙක්ටයාර් එකයි දශම දෙකයි නවයයි බිංදුවක් (හෙක්ටයාර් 1.290) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

08-150/10

---

**සෙලාන් බැංකුව පීඑල්සී - උපාධිධාරී ව්‍යවසායකත්ව ණය ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.25 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0210-01920834-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් විරාජ් වික්‍රමරත්න විසින් සහතික කරන ලද 2006 ජූලි මස 07 දිනැති අංක 71 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මැදවච්චිය පදිංචි සේදර ලියනගේ අජිත් චන්ද්‍රරත්න සහ සේදර ලියනගේ චන්ද්‍රරත්න යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ තිස්හතර දහස් හයසිය තිස්හයයි ශත විසිඅටක (රු. 9,34,636.28) මුදලක්, 2009 ජූනි මස 19 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 9,34,636.28 මුදල ද, 2009 ජූනි මස 20 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 71 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල

අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ, කඩවත කෝරළේ, මැදවච්චිය ප්‍රාදේශීය සභා සීමාව තුළ මැදවච්චිය පිහිටි බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 2005.04.05 දිනැති අංක 4640 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මැදවච්චිය කැලේ නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1296 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : අංක 2344 දරන සැලැස්මේ සඳහන් ලොට් 16 ද, දකුණට : පාර සහ බස්නාහිරට : අංක 2344 සැලැස්මේ සඳහන් ලොට් 14 ද යන මායිම් තුළ එකී අංක 4640 දරන සැලැස්ම අනුව පර්චස් දොළහයි දශම එකයි හයක් (අ. 0, රූ. 0, පර්. 12.16) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත විස්තර කරන ලද එකී අංක 4640 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එකී ලොට් 1 ලකුණු කළ ඉඩම් කැබැල්ල පහත සඳහන් පරිදි විස්තර කරනු ලබන ඉඩම හා සමාන වේ :

පෙර කී මැදවච්චිය පිහිටි බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 1993.06.24 දිනැති අංක 2344 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මැදවච්චියකැලේ නමැති ඉඩමේ ලොට් 15 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1296 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : අංක 2344 දරන සැලැස්මේ සඳහන් ලොට් 16 ද, දකුණට : එකී අංක 2344 දරන සැලැස්මේ සඳහන් ලොට් 27 (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : අංක 2344 සැලැස්මේ සඳහන් ලොට් 14 ද යන මායිම් තුළ එකී අංක 2344 දරන සැලැස්ම අනුව පර්චස් දොළහයි දශම එකයි හයක් (අ. 0, රූ. 0, පර්. 12.16) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී අංක 2344 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 27 ලකුණු කළ මාර්ගය සඳහා වෙන් කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

08-150/9

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නිට්ටඹුව ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රුවනගල ප්‍රේමචන්ද්‍ර.

2010.03.31 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2005.10.18 දිනැති සහ අංක 5143 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රුවනගල ප්‍රේමචන්ද්‍ර යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අනූනවදහස් විසිතුනයි ශත තිස්නවය (රු. 4,99,023.39) ක මුදලක් 2010.02.28 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 4,99,023.39ක මුදලට 2010.03.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5143 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභාවෙහි පල්ලේවෙල උප කාර්යාල සීමාව තුළ මාලිගාතැන්න, වදුරාව ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසය තුළ පිහිටි “මාලිගාතැන්න” නමැති ඉඩමට බලයලත් මානක එස්. පී. ආර්. පතිරාජ විසින් 2004 නොවැම්බර් මස 17 වැනි දින සහ අංක 3140 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 8 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 6 සහ 10න් ද, නැගෙනහිරට : ලොට් 9න් ද (අඩි 15ක් පළලැති පාර), දකුණට : ප්‍රාදේශීය සභා පාරෙන් ද, බස්නාහිරට : ලොට් 7 සහ 6න් ද, මායිම් වූ එකී අංක 3140 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්හය (අ. 0, රූ. 0, පර්. 36) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි නවයයි එකයි බිංදුව (හෙක්. 0.0910) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේත් සමග පිහිටි ඉඩම. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 8සී/270 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ලොට් 9ට අයත් අංක 3140 දරන පිඹුරේ වැඩිදුරටත් විස්තරවන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

08-154/3

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

පී. එච්. පී. එම්. ප්‍රනාන්දු සහ ඩබ්ලිව්. එම්. ඒ. බී. එස්. ප්‍රනාන්දු.
ගිණුම් අංක : 0007 5010 1283.

සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010ක් වූ අප්‍රේල් මස 27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. වීබැද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2005 අප්‍රේල් මස 26 දාතම හා අංක 561 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොන්නම්පෙරුමගේ හෙන්රි ප්‍රදීප් මිල්රෝයි ප්‍රනාන්දු සහ වර්ණකුලසූරිය මහලේකම්ගේ ඊවා බර්නඩින් සොනාලි ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී පොන්නම්පෙරුමගේ හෙන්රි ප්‍රදීප් මිල්රෝයි ප්‍රනාන්දු උකස්කරු වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ තිස්නම දහස් අටසිය හැටතුනයි ශත පහක (රු. 8,39,863.05) මුදලක් 2010 ජනවාරි මස 14 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අටලක්ෂ තිස්නම දහස් අටසිය හැටතුනයි ශත පහක (රු. 8,39,863.05) මුදලද 2010 ජනවාරි 15 දින සිට අංක 561 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත්ලක්ෂ හැට දෙදහස් තිහක (රු. 7,62,030) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වේනොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 561 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි , 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

1. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්සරම් පත්තුවේ පම්බල ග්‍රාමයේ පිහිටි "නුගගහයාය" ("වෙල් - වනාත" වශයෙන් ලියාපදිංචි වී ඇති නමුත්) යැයි කියනු ලබන ඉඩමෙන් බලයලත් මානක තැන ඩී. ප්‍රසාද් විමලසේන යන අය විසින් සාදන ලද 1995 සැප්තැම්බර් මස 02, 17 සහ 20 දාතම හා අංක 1676 දරන පිඹුරේ ලොට් 07 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 1 සහ 6, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 5 සහ ජී. සී. ද සිල්වා යන අයගේ ඉඩම ද, දකුණට : ජී. සී. ද සිල්වා යන අයගේ ඉඩම සහ බස්නාහිරට : ඩබ්ලිව්. ස්ටැන්ලි ප්‍රනාන්දු යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් පහයි දශම තුනක් (අ. 0. රූ. 1, පර්. 35.3) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1676 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ඩී171/60 යටතේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී පම්බල ග්‍රාමයේ පිහිටි "වෙල් - වනාත" (නුගගහයාය වශයෙන් ලියාපදිංචි වී ඇති නමුත්) යයි කියනු ලබන ඉඩමෙන් බලයලත් මානක තැන ඩී. ප්‍රසාද් විමලසේන යන අය විසින් සාදන ලද 1995 සැප්තැම්බර් මස 02, 17 සහ 20 දාතම හා අංක 1676 දරන පිඹුරේ ලොට් 06 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 3, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 4, දකුණට : එකී පිඹුරේ ලොට් 07 සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම අටක් (අ. 0. රූ. 0, පර්. 3.8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1676 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව සී171/59 යටතේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

එකී පම්බල ග්‍රාමයේ පිහිටි "නුගගහයාය" සහ "වෙල් - වනාත" යයි කියනු ලබන ඉඩමෙන් බලයලත් මානක තැන ඩී. ප්‍රසාද් විමලසේන යන අය විසින් සාදන ලද 1995 සැප්තැම්බර් මස 02, 17 සහ 20 දාතම හා අංක 1676 දරන පිඹුරේ ලොට් 3 (පාර සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 2, නැගෙනහිරට : කොළඹ-හලාවත ප්‍රධාන පාර, දකුණට : එකී පිඹුරේ ලොට් 04 සහ 06 සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම් කොටස එකී අංක 1676 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව සී175/35 යටතේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-141/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ඒ. එල්. එස්. ප්‍රසන්ත.
ගිණුම් අංක : 0066 5000 2723.

සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010ක් වූ අප්‍රේල් මස 27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරගල යන අය විසින් ලියා සහතික කරන ලද 2006 නොවැම්බර් මස 28 දාතම හා අංක 13742 දරන හා 2006 අගෝස්තු මස 18 දාතම හා අංක 13467 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අම්බලන්ගොඩ ලියනගේ සුගත් ප්‍රසන්න යන අය බන්ධනදායීන් වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසිනම ලක්ෂ තිස්පන් දහස් තුන්සිය හැත්තෑ පහයි ශත හැට හතක (රු. 29,35,375.67) මුදලක් 2010 පෙබරවාරි මස 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් විසිනම ලක්ෂ තිස්පන් දහස් තුන්සිය හැත්තෑ පහයි ශත හැට හතක (රු. 29,35,375.67) මුදල ද 2010 පෙබරවාරි 12 දින සිට අංක 13742 සහ 13467 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිතුන් ලක්ෂ දහහත් දහස් පන්සිය පනස් දෙකයි ශත තිස් හතක (රු. 23,17,552.37) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතයි දශම පහක් (17.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 13742 සහ 13467 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, මහගල්බොඩ මෙගොඩ කෝරළේ, "උයන්දන පිහිටි උයන්දන එස්ටේට් නොහොත් සුන්දරවල්ලි වත්ත සහ දුම්මල්ල මුල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර යන අය විසින් සාදන ලද 1993 දෙසැම්බර් මස 31 දාතම හා අංක 202/93 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 54 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසාණට : එකී පිඹුරේ ලොට් 18 (පාර), ගිණිකොණට : එකී පිඹුරේ ලොට් 53 (පාර), නිරිතට : එකී පිඹුරේ ලොට් 55, වයඹට : එකී පිඹුරේ ලොට් 57 යන මායිම තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහහතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 14.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයක් ද සමග වෙළුම/පත්‍රිරුව A1514/277 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-141/2

**සෙලාන් බැංකුව පීඑල්සී - බොරලැස්ගමුව ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0340-578066-001 සහ 0340-372073-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.08 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. කේ. මාම්පිටිය විසින් දෙකම සහතික කරන ලද 2002 ජනවාරි මස 10 දිනැති අංක 662 සහ 2003 ඔක්තෝබර් මස 22 වැනි දිනැති අංක 1133 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව් 65754 දරන "සිලෝන් ඔෂීමා කම්පනි " යන නාමය විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන දෙදෙනාම කොහුවල පදිංචි ජයසේකර ගංගොඩ ආරච්චිරාලලාගේ විජේරත්න සහ ගංගොඩ ආරච්චිරාලලාගේ ප්‍රසන්න කුමාර ජයසේකර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහසයලක්ෂ හැටඑක්දහස් හයසිය හැටහතරයි ශත පනස් එකක (රු. 16,61,664.51) මුදලක්, 2009 ජූනි මස 26 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 16,61,664.51 මුදල ද, 2009 ජූනි මස 27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 662 සහ 1133 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ කළුබෝවිල නැගෙනහිර පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 2001 අගෝස්තු මස 08 දිනැති අංක 2001/51 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වුඩ්ලන්ඩ් ඇවනියු වරිපනම් අංක 22/19 සහ 22/20 දරන බරුබේරිය වත්ත සහ බරුබේරිය ඕවිට නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එන්. එස්. පී. ජයවර්ධන සහ තවත් අයගේ කුඹුර ද, නැගෙනහිරට : අංක 1734 දරන සැලැස්මේ සඳහන් ලොට් සී (වුඩ්ලන්ඩ් ඇවනිවු වරිපනම් අංක 22/21) ද, දකුණට : ලොට් 3 සහ 2 සහ බස්නාහිරට : එකී අංක 1734 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ 1 (වුඩ්ලන්ඩ් ඇවනියු වරිපනම් අංක 28/2) ද යන මායිම් තුළ එකී අංක 2001/51 දරන සැලැස්ම අනුව පර්චස් දහයයි දශම හතරයි හතරක් (අ. 0, රූ. 0, පර්. 10.44) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය දෙල්කඳ

ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2602/51 යටතේ ලියාපදිංචිකර ඇත.

2. පෙර කී කළුබෝවිල නැගෙනහිර පිහිටි එකී අංක 2001/51 දරන සැලැස්මේ පෙන්නුම්කරනු ලබන වුඩ්ලන්ඩ් ඇවනියු වරිපනම් අංක 22/19 සහ 22/20 දරන බරුබේරිය වත්ත සහ බරුබේරිය ඕවිට නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : පාර (1 වැනි පටුමග) ද, සහ බස්නාහිරට : එකී අංක 1734 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ1 (වුඩ්ලන්ඩ් ඇවනියු වරිපනම් අංක 28/2) ද යන මායිම් තුළ එකී අංක 2001/51 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම හතයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 9.72) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2602/52 යටතේ ලියාපදිංචිකර ඇත.

3. පෙර කී කළුබෝවිල නැගෙනහිර පිහිටි එකී අංක 2001/51 දරන සැලැස්මේ පෙන්නුම්කරනු ලබන වුඩ්ලන්ඩ් ඇවනියු වරිපනම් අංක 22/19 සහ 22/20 දරන බරුබේරිය වත්ත සහ බරුබේරිය ඕවට නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : එකී අංක 1734 දරන සැලැස්මේ සඳහන් ලොට් සී (වුඩ්ලන්ඩ් ඇවනියු වරිපනම් අංක 22/21) ද, දකුණට : පාර (1 වැනි පටුමග) ද සහ බස්නාහිරට : ලොට් 2 ද යන මායිම් තුළ එකී අංක 2001/51 දරන සැලැස්ම අනුව පර්චස් දෙකයි දශම පහයි හතක් (අ. 0, රූ. 0, පර්. 2.57) විශාල ගොඩනැගිලි ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2602/53 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

බලයලත් මිනින්දෝරු ජී. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1953 සැප්තැම්බර් මස 06 සහ 13 දිනැති අංක 176ඒ දරන සැලැස්මේ පෙන්නුම්කරනු ලබන ලොට් එෆ් (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ ලොට් එල් (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ ප්‍රමාණයෙන් පිළිවෙලින් පර්චස් පහයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 5.50) සහ පර්චස් දෙකයි දශම එකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 2.12) විශාල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිළිවෙලින් එම් 801/142 සහ එම් 801/143 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

08-150/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කෝපරේට් බෑන්කිං යුනිට් ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0864-351902-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.23 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. කේ. මාම්පිටිය විසින් දෙකම සහතික කරන ලද 2001 මාර්තු මස 02 දිනැති අංක 503 සහ 2003 මැයි මස 13 වැනි දිනැති අංක 964 සහ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. ආර්. අමරසේන විසින් සහතික කරන ලද 2006 ජනවාරි මස 02 දිනැති අංක 468 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම නුගේගොඩ ව්‍යාපාර ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 21525 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන "මැල්කෝ ඉන්ජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්" සහ නුගේගොඩ පදිංචි පෙලවාසිගේ අමලා මේරි ලයිස් ඩිලයිලා විජේසිංහ විවාහට පෙර වාස් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූදෙලක්ෂ අනූහය දහස් අටසිය විසිහතරයි ශත දහහතක (රු. 92,96,824.17) මුදලක්, 2009 නොවැම්බර් මස 05 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 92,96,824.17 මුදල ද, 2009 නොවැම්බර් මස 06 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 503, 964 සහ 468 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-141/3

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වර්ණකුලසූරිය එඩ්ගා ජෙරී ද මෙල්.
ණය ගිණුම් අංකය : 389139.

2010 ජනවාරි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස සම්මත කර ගන්නා ලදී.

වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා විසින් 2007 අගෝස්තු මස 30 වැනි දින සහතික කරන ලද අංක 31239 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වර්ණකුලසූරිය එඩ්ගා ජෙරී ද මෙල් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන දෙකක් සහ අටසිය හතලිස්

හත්දහස් අටසිය එකොළහයි ශත පනස් පහක (රු. 28,47,811.55) මුදලක් 2009 ජූලි මස 21 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දෙකක් සහ අටසිය හතලිස් හත්දහස් අටසිය එකොලහයි ශත පනස් පහක (රු. 28,47,811.55) මුදල අයකර ගැනීම සඳහා 2009 ජූලි මස 22 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 19,66,650ක මුදල මත 22%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද, දරන ලද වෙනත් වියදම් වෙතොත් ඒවාද මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 31239 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ස්ෆ්ඩෝප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය සම්මත කර ගනී.

### උපලේඛනය

අනුඥාලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් 2007 මාර්තු මස 11 වැනි දින සාදන ලද අංක 5681 දරන පිඹුරෙහි දැක්වෙන වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ උතුරු පිටිගල් කෝරළේ, මුන්නේශ්වරම් පත්තුවේ, කාක්කපල්ලිය ග්‍රාමයේ පිහිටි යායේ ඉඩම කියන ඉඩමේත් එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 2 ලෙස ලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : පොකුණේ සිට ප්‍රධාන පාර දක්වා ඇති ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : එකී පිඹුරු අංක 5681හි සඳහන් ලොට් 3 ද, දකුණට : එම්. එම්. එස්. අප්පුහාමිගේ ඉඩම ද සහ බස්නාහිරට : එකී පිඹුරු අංක 5681 හි සඳහන් ලොට් 1 ද යන මායිම් තුළ රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම.

එකී ඉඩම පෙර කී පිඹුරු අංක 5681හි සඳහන් පෙර කී කාක්කපල්ලිය ග්‍රාමයේ පිහිටි යායේ ඉඩම කියන ඉඩමේ යාබද බිම් කට්ටි 1 සහ 2න් එහි පවත්නා අනෙකුත් සියළු දේත් සමග බෙදා වෙන් කරන ලද කොටසක් වන අතර එක් ඉඩමක් ලෙස සැදුම්ලත් එකී ලොට් 1 සහ 2ට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : එකී පිඹුරු අංක 5681හි සඳහන් ලොට් 3 ද, දකුණට : එම්. එම්. එස්. අප්පුහාමිගේ ඉඩම ද සහ බස්නාහිරට : අනුඥාලත් මිනින්දෝරු කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා විසින් සාදන ලද අංක 772 දරන පිඹුරෙහි සඳහන් ලොට් 8 ද යන මායිම් තුළ අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාල ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C188/201 වෙළුමෙහි/පත්‍ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

08-87

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 10/64311/ඩී10/470.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.06.29 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ෆාරුක් විසින් සහතික කරන ලද 1998.09.14 දින හා අංක 1756 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අම්බලන්තොට පදිංචි ගුණරත්න ගමගේ විමලසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.06.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ තිස් නවදහස් අටසිය අනූනවයයි ශත අනූ අට (රු. 1,39,899.98)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1756 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් පනස් හතරයි ශත අනූව (රු. 54.90) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ධර්මාරාම මාවත, අංක 14හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ අම්බලන්තොට වලවේ ගමේ පිහිටි තංගල්ල පාර වරිපනම් අංක 61/3/ඒ දරන අඹගහවත්ත නමැති ඉඩමට 1997.02.10 සහ 1997.05.13 දින බලයලත් මිනින්දෝරු අයි. පී. ගාල්ලගේ විසින් මැන සකසන ලද අංක 453 දරන පිඹුරේ කැබලි අංක 02 බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 9.15ක් වූ බිම් කොටස සමග සියලු දේත් වේ.

මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 60/104 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 453 දරන පිඹුරේ කැබලි අංක 3 (අඩි 13ක් පළල පාර) සහිත කොටස වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූලි මස 22 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

08-99

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990

අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එල්. වී. ද සිල්වා විසින් ලියා සහතික කරන ලද අංක 4887 හා 2007 නොවැම්බර් මස 13 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ගාල්ලේ, සේමගේ චන්ද්‍ර කුමාර අබේරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ඔක්තෝබර් මස 31 වැනි දිනට, ඉහත කී අංක 4887 දරන උකස් බැඳුම්කරය මත එකී සේමගේ චන්ද්‍ර කුමාර අබේරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හැටහතර ලක්ෂ පනස් දහස් හත්සිය හැත්තෑ නවයකුත් ශත පනස් නවයක (රු. 64,50,779.59) මුදලක් සහ 2009 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටලක්ෂ හතලිස් එක්දහස් හයසිය විසිදෙකකුත් ශත පනස් නවයක (රු. 60,41,622.59) මුදලක් සඳහා වර්ෂයකට සියයට දහතුන බැගින් (13%) පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හැටහතර ලක්ෂ පනස් දහස් හත්සිය හැත්තෑ නවයකුත් ශත පනස් නවයක (රු. 64,50,779.59) මුදලක් සහ 2009 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටලක්ෂ හතලිස් එක් දහස් හයසිය විසිදෙකකුත් ශත පනස් නවයක (රු. 60,41,622.59) මුදලක් සඳහා වර්ෂයකට සියයට දහතුන බැගින් (13%) පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීමසඳහා ඉහත කී අංක 4887 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් හා සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 4887 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

01. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර සහ ගාල්ල මහනගර සභා සීමාව ඇතුළත කුඹල්වැල්ලේ පිහිටි එම්. ඩී. රත්නසූරිය මාවත යනුවෙන් ද හැඳින්වෙන, බටගන්විල නව පටුමගේ (Bataganwila New Lane) වරිපනම් අංක 4 (අභාවිත අංක 85) දරන දෙනියවත්ත ලොට් 2A සහ 2Y නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු යූ. වේවැල්වල විසින් මැන සකස් කළ අංක 205 හා 2000.09.29 දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන ලොට් $2A^1$ ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ගොඩේවත්ත සහ පොල්කනත්ත ද, නැගෙනහිරට : ගල්ඇන්දේ වත්ත සහ මෙම ඉඩමේ ලොට් 2A2 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 2A2 ද, දකුණු-බස්නාහිරට : එම්. ඩී. රත්නසූරිය මාවත ද යන මායිම් ඇතුළත ඉහත සඳහන් අංක 205 දරන පිඹුරට අනුව රූඩ් දෙකකුත් පර්චස් විසිහයකුත් දශම හයක් (අ. 0. රූ. 2, පර්. 26.6) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම් සහ එහි පිහිටි සියලු වැවිලි ද වේ.

02. ඉහත කී කුඹල්වැල්ලේ එම්. ඩී. රත්නසූරිය මාවත යනුවෙන් ද හැඳින්වෙන, බටගන්විල නව පටුමගේ (Bataganwila New Lane) වරිපනම් අංක 4 (අභාවිත අංක 85) දරන දෙනියවත්ත ලොට් 2A සහ 2Y නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු යූ. වේවැල්වල විසින් මැන සකස් කළ අංක 205 හා 2000.09.29 දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන ලොට් අංක $2A^2$ ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරු-නැගෙනහිරට : ගල්ඇන්දේ වත්ත ද, දකුණු-නැගෙනහිරට : ශ්‍රී සද්ධාතිස්ස මාවත ද, දකුණු-බස්නාහිරට : එම්. ඩී. රත්නසූරිය මාවත ද, උතුරට සහ උතුරු බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් $2A^1$ ද යන මායිම් ඇතුළත ඉහත සඳහන් අංක 205 දරන පිඹුරට අනුව රූඩ් දෙකකුත් පර්චස් දහනවයයි දශම දෙකක් (අ. 0, රූ. 2, පර්. 19.2) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි සියලු වැවිලි හා ගොඩනැගිලි ද වේ.

ඉහත සඳහන් ලොට් $2A^1$ සහ $2A^2$ ලකුණු කළ ඉඩම් මෙහි පහත විස්තර කර තිබෙන මුල් ඉඩමෙන් (parent land) බෙදා වෙන් කළ කොටස් වන අතර එම මුදල් ඉඩමට නිසි පරිදි සම්බන්ධ කර ලියාපදිංචි කළ යුතු වේ.

ඉහත කී කුඹල්වැල්ලේ එම්. ඩී. රත්නසූරිය මාවත යනුවෙන් ද, හැඳින්වෙන, බටගන්විල නව පටුමගේ වරිපනම් අංක 4 (අභාවිත අංක 85) දරන දෙනියවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කළ ලොට් 2A සහ 2Y දරන කොටස්වලට ගාල්ල දිසා අධිකරණයේ අංක 17628 දරන බෙදුම් නඩුවට ගොනුකර තිබෙන බලයලත් මිනින්දෝරු එස්. එච්. දහනායක විසින් මැන සකස් කළ අංක 856A හා 1963.09.24 දින දරන පිඹුර ප්‍රකාර සහ ඉන් පසුව කරන ලද අතුරු බෙදීමට අනුව මායිම්, උතුරට : ගොඩේවත්ත සහ පොල්කනත්ත ද, නැගෙනහිරට : ගල්ඇන්දෙවත්ත සහ පොතුකුඹුර ද, දකුණට : පොතුකුඹුර වට අද්දර ඕවිට සහ ලොට් අංක 3 ද, බස්නාහිරට : ඉඩමේ ලොට් අංක 3 ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් තුනකුත් පර්චස් දහසයයි දශම පහයි දෙකක් (අ. 1, රූ. 3, පර්. 16.52) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

08-127

---

**මහජන බැංකුව - පේදුරුතුඩුව ශාඛාව**

1986 වර්ෂයේ අංක 32 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය මගින් සංශෝධනය කරනු ලැබූ වර්ෂ 1961 අංක 32 දරන වගන්තිය යටතේ ගන්නා ලද තීරණය

1986 වර්ෂයේ අංක 32 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය මගින් සංශෝධනය කරනු ලැබූ වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තියේ ප්‍රතිපාදන යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.06.27 දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් තීරණය ඒකමතිකව ගන්නා ලද බව මෙමගින් දන්වනු ලැබේ.

සච්චිතානන්දම් සූරියප්පෙරුමාන් මයා යන අය අංක 4403 දරන 2004.05.30 දාතමින් සහ අංක 5145 දරන 2005.05.19 දාතමින් යුත්

යාපනයේ ප්‍රසිද්ධ නොතාරිස් ලිංගා තුරෙයිරාජා මිය විසින් සහතික කරන ලද මහජන බැංකුවට වාසි සහිත උකස්කරය යටතේ ගෙවිය යුතු අංක 4403 ඇපකරයේ මුදල වන රුපියල් දසලක්ෂ පනස්පන්දහස් පන්සීයය (රු. 10,55,500) සහ අංක 5145 උකස්කරයේ මුදල වන රුපියල් දහතුන් ලක්ෂ විසිපන්දහස (රු. 13,25,000) බැංකුවට නොගෙවා කඩකර ඇති නිසා එකී මුදල බැංකුවට අයවිය යුතුව ඇත. මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1961 වර්ෂයේ අංක 29 දරන පනත හා 1986 වර්ෂයේ අංක 32 දරන සංශෝධන පනතේ 29ඩී වගන්තියේ ප්‍රතිපාදන මගින් තමන් වෙත පැවරී ඇති බලතලවලට යටත්ව එකී අංක 4403 සහ 5145 දරන උකස්කරයන් මගින් බැංකුවට උකස්කර ඇති ඉඩම් දේපළ යාපනයේ බලයලත් වෙන්දේසිකරු කාර්තිගේසු පොන්නයියා බාලක්‍රිෂ්ණන් මහතා විසින් ප්‍රසිද්ධියේ වෙන්දේසි කර විකුණා එකී ඇපකර අංක 4403 හි මුදල් වන රුපියල් දසලක්ෂ පනස්පන්දහස් පන්සීයය ද (රු. 10,55,500) රුපියල් දසලක්ෂ පනස් දහසකට (රු. 10,50,000) 2006.01.01 දින සිට විකිණීමේ දිනය දක්වා තවත් පොළී මුදල් වශයෙන් 20.25% ප්‍රමාණයක් ද අංක 5145 උකස්කරයේ මුදල වන රුපියල් දහතුන් ලක්ෂ විසිපන්දහසද (රු. 13,25,000) ද, රුපියල් දහතුන් ලක්ෂ විසි පන්දහසක (රු. 13,25,000) 2006.11.06 දින සිට 20.25% පොළියක් ද මහජන බැංකු පනත 29එල් විධිවිධාන අනුව අයකරගත යුතු වියදම් හා වෙනත් අයකිරීම් ආදිය ද මෙතෙක් යම්කිසි ගෙවීමක් කර ඇත්නම් ඒවා අඩුකර ගෙන අයකිරීමට ද තීරණය කර ඇත.

### උකස්කර ඇති ඉඩම් දේපළ විස්තරය

01. උතුරු පළාත, යාපනය දිස්ත්‍රික්කය, වඩමාරච්චි ප්‍රදේශය, පේදුරුතුඩුව පැරිෂිය වෙන්රිපාකුදේවන් කුරිච්චියෙහි පිහිටි "ආයිල්නින්රකලට්ටි" නමැති ඉඩමේ බිම් ප්‍රමාණය ලාච්චම් 01යි, ව. ස. කුළි 14ක් ඔප්පුව අනුව සඳහන් කර ඇතත්, අංක 1718 හා 2005.03.06 දින දරන අවසරලත් මිනින්දෝරු ඒ. වේල්මුරුගු මයාගේ සිතියම අනුව ඉඩම් කොටස් අංක 1 යනුවෙන් දැක්වූ බිම් ප්‍රදේශය ව. ස. ලාච්චම් 01, කුළී 14 සමග නිවසක්, ගොඩනැගිලි සහ උපාංගයන් සියල්ල සමග යනුවෙන් ද පෙන්නුම් කර ඇත. මේ සඳහා මායිම්, නැගෙනහිරින් : රාසයියාගේ වැන්දඹුව වන ලට්චම්පිල්ලයිගේ හිමිකරුවන්ගේ ඉඩම, උතුරින් : විශ්වලිගම් වේලායුදම්ගේ ඉඩම, බටහිරින් : ප්‍රධාන වීදිය සහ දකුණින් : සතදේවි දේවාලයට අයත් ඉඩම හා පටුමග සමග උතුරු මායිමේ පිහිටි ළිඳෙන් 2/3ක කොටසක් මේවා පේදුරුතුඩුව ඉඩම් කාර්යාලයේ අංක ඒ/579/167 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
උතුරු කළාපය.

08-108

---

1. මහජන නොතාරිස් වී. විනෝබා ඉන්ද්‍රන් මහතා විසින් සහතික කරන ලද 2007.03.09 දිනැති අංක 13606 දරන බැඳුම්කරය මත ණය ගිණුම වෙනුවෙන් මුල් මුදල හා 2010.03.17 දින තෙක් පොලිය වශයෙන් රුපියල් හත්ලක්ෂ නවදහස් හාරසීය හැටතුනයි ශත අසූනවයක (රු. 7,09,463.89) මුදලක් සමග රුපියල් පන්ලක්ෂ පනස් අට දහස් එකසිය හැත්තෑහයයි ශත හතලිස් පහක (රු.5,58,176.45) මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් තවදුරටත් පොලියක්ද. 2010.03.18 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කලුවන්චිකුඩි, එරුවිල්, චෝඩි පාර හි පදිංචි සන්තිරපිල්ලෙයි අන්නලෙච්චුමී මහත්මිය යන අයගෙන් අයවියයුතුව ඇත.

2. එකී අංක 13606 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හත්ලක්ෂ නවදහස් හාරසීය හැටතුනයි ශත අසූනවයක (රු.7,09,463.89) මුදල සමග 2010.03.18 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මඩකලපුව, මුඩ්ලියර් පාර, අංක 8 හි පදිංචි වෙන්දේසිකාර ඒ. ඊ. කේ. වීරසිංහ මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරුවිල් පත්තුවේ, දකුණු එරුවිල් පත්තුවේ, මාන්මුනෙයි ප්‍රාදේශීය සභා සීමාව තුළ, එරුවිල් ග්‍රාමයේ පිහිටි "ඊස්ටන් සීටෝන් ගෲප්" නමැති ඉඩම් කැබැල්ලෙහි දකුණු කොටසෙහි නැගෙනහිර අර්ධය එනම් දැනට බලයලත් මිනින්දෝරු හා තලම්තිකාර ඒ. සිංගරාජා විසින් සාදන ලද 2006.06.10 දිනැති අංක AS/ MS and EP/ 49 දරන මැනුම් පිඹුරේ ලොට් 01 ලෙස වඩාත් සම්පූර්ණව විස්තර කර ඇති මනින ලද ඉඩම් කැබැල්ල රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, නැගෙනහිරට : ඉරාසලෙච්චමීගේ ඉඩමද, බස්නාහිරට : වෙල්ලයියාපොඩි පංචවර්ණම්ගේ ඉඩම ද, දැනට පටුමගක් ද, උතුරට : උදය කුමාරතිගේ ඉඩම ද, දකුණට : සන්තානාපිල්ලෙගෙ ඉඩම ද, මායිම්ව මෙම ඉඩමෙන් වෙන්කර ඇති පටුමග මතින් ඉඩමට පිවිසීමට හා පිටවීමට අයිතිය සහ වෙනත් සියළු අයිතීන්ද සතුවේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එන්. අරුඩ්ජෝති,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
කලුවන්චිකුඩි.

08-72

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.06.17 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.04.27 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

1. මහජන නොතාරිස් වී. විනෝබා ඉන්දන් මහතා විසින් සහතික කරන ලද 2005.08.18 දිනැති අංක. 12162 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.02.02 වෙනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් තුන්ලක්ෂ අසූහතර දහස් පනහයි ශත විසිතුනක (රු.3,84,050.23) මුදලක් සමග රුපියල් අනූඑක් දහස් පනස් නවයයි ශත තිස්එකක (රු.91,059.31) මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් පොලියක් ද, 2010.02.03 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මඩකලපුව, වෙට්ටිපාලයම් උතුර හි පදිංචි සිවසම්පු නවනීදන් මහතා සහ කන්දයියා සිවසම්පු මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 12162 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් තුන්ලක්ෂ අසූහතර දහස් පනහයි ශත විසිතුනක (රු.3,84,050.23) මුදල සමග 2010.02.03 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවියයුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මඩකලපුව, මුඩ්ලියර් පාර, අංක 08 හි පදිංචි වෙන්දේසිකාර ඒ. ඊ. කේ. තිස්සවීරසිංහ මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තර

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවිල් පත්තුවේ, එරාවිල්පත්තු මන්මුනෙයි දකුණ ප්‍රාදේශීය සභා සීමාව තුළ, වෙට්ටිපාලයම් හි පිහිටි උතුරු දෙසට වූ කොටසෙහි අර්ධ එනම්, නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයිපත්තුවේ, වෙට්ටිපාලයම් හි පිහිටි "වෙම්පි කන්නාච්චි වලවු" නමැති ඉඩම් කැබැල්ල නැගෙනහිර සිට බටහිරට බඹ 18 ක් ද, උතුරේ සිට දකුණට බඹ 17 ක් ද යන බිම් ප්‍රමාණයකින් යුක්තව නැගෙනහිරට : පට්ටාර් කුමාරවේලු හා වෙනත් අයගේ උරුමකරුවන් ද, බස්නාහිරට : කුලවේලි ද, උතුරට : අතුරු පටුමග ද, දකුණට : මුත්තම්බිගේ උරුමක්කරුවන්ගේ ඉඩම විලා නගර් වලව් සහ කුලවේලි ද මායිම්ව නැගෙනහිර සිට බටහිරට බඹ 18 කින්ද සමන්විත වන අතර, බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු ඒ. සිංගරාජා විසින් සාදන ලද 2003.08.11 දිනැති අංක. AS/2003/779 දරන පිඹුරේ වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කර ඇති අතර, පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) ප්‍රමාණයෙන් යුක්තව නැගෙනහිරට අතුරු පටුමගද, බස්නාහිරට පෙරින්පරාජාගේ ඉඩමද, උතුරට ප්‍රධාන පාර දක්වා දිවෙන අතුරු පටුමගද, දකුණට උදයකුමාර්ට අයිති නිවෙස ළිඳ සහ වෙනත් සියළු අයිතීන් සතු අනෙක් කොටසද අඩංගුය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ආරුමුගම්,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මඩකලපුව.

08-71

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.06.17 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

1. මහජන නොතාරිස් එම්. අයි. එම්. නූර්දීන් මහතා විසින් සහතික කරන ලද 2006.11.30 දිනැති අංක. 18084 දරන බැඳුම්කරය මත ණය ගිණුම වෙනුවෙන් මුල් මුදල හා 2010.03.11 වෙනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් දෙලක්ෂ දහඅට දහස් නවසිය විසිනවයයි හත අසූවක (රු.2,18,929.80) මුදලක් සමග රුපියල් එක්ලක්ෂ හැටතුන් දහස් විස්සයි ශත පනස් නවයක (රු.1,63,020.59) මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් තවදුරටත් පොලියක්ද, 2010.03.12 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මඩකලපුව, පුදුනගර් 73 Aහි පදිංචි ජෝන් කැලිස්ටන් ජෝකුමාර් මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක. 18084 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දෙලක්ෂ දහඅට දහස් නවසිය විසිනවයයි ශත අසූවක (රු.2,18,929.80) මුදල සමග 2010.03.12 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මඩකලපුව මුඩ්ලියර් පාර, අංක 8 හි පදිංචි වෙන්දේසිකාර ඒ. ඊ. කේ. තිස්සවීරසිංහ මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මාන්මුනෙයිපත්තුවේ, වීච්චුකල්මුනෙයි ග්‍රාමයේ රෙදි විවීමේ මධ්‍යස්ථාන පාරේ පිහිටි "ආට්ටංකරෙයිවලච්ච" නමැති ඉඩම් කැබැල්ලෙහි නැගෙනහිර කොටස උතුරට : අඩි 10 පළල පාර ද, නැගෙනහිරට : වාචිතිඩාල් ද, දකුණට: සෙබස්තියන්ගේ ඉඩම ද, බස්නාහිරට : ඥාණමුත්තු ජෝන් සහ අන්නාමේරිගේ ඉතිරි ඉඩමද මායිම්ව උතුරේ සිට දකුණට නැගෙනහිර පැත්තෙන් අඩි 186 ක්ද, බටහිර පැත්තෙන් අඩි 140 ක් ද, නැගෙනහිර සිට බටහිරට උතුරු පැත්තෙන් අඩි 65 ක් ද, දකුණ පැත්තෙන් අඩි 109 ක බිම් ප්‍රමාණයකින් යුක්තවේ. මේ සමග එහි සියළු අයිතීන්ද ඇතුළත් ය. මෙය B537/24 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිස්සවීරසිංහ විසින් අඳින ලද 2006.06.29 දිනැති අංක 797/2006 දරන පිඹුරෙහි විස්තර කරන ලද ඉඩම පහත පරිදිය.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයිපත්තුවේ, මන්මුනෙයි උතුරු පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩකලපුව මහ නගර සභා සීමාවේ අංක SU-01 දරන වීච්චුකල්මුනෙයි ග්‍රාමයේ රෙදිවිවීමේ මධ්‍යස්ථානය පාරේ පිහිටි වරිපනම් අංක 124/1C දරන බලයලත් මිනින්දෝරු 2006.06.29 දිනැති අංක 797/2006 දරන පිඹුරෙහි නිරූපිත "ආට්ටංකරෙයි වලච්ච" නමැති ඉඩම් කැබැල්ල පාරට (මා. ස. අ.) දිවෙන මීටර් 4.5 පළල පටුමග ද, නැගනෙහිරට : පළලින් මීටර් 4.5 ක් වූ රිසවේසම ද, දකුණට : යූ. සෙබස්තියන් හා වෙනත් අය උරුමකම් කියන වත්ත ද, බස්නාහිරට : ජී. ජෝන් සහ අන්නාමේරි උරුමකම් කියන ඉඩමද, මායිම්ව හෙක්ටයාර් 0.0610 ක් හෝ පර්චස් විසිහතරයි දශම එකයි එකක (අ. 0, රූ. 0. පර්. 24.11) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මේ සමග එහි සියළු අයිතීන්ද අඩංගුය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ආරුමුගම්,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
මඩකලපුව අධිශ්‍රේණි ශාඛාව,
මඩකලපුව.

08-73

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

කයාටා ලොජිස්ටික්ස්
ගිණුම් අංක : 0012 1000 2614

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 ජූනි මස 24 වෙනි දින පවත්වන්නට යෙදුන රැස්වීමෙදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. ඩී. ප්‍රසංග යන අය විසින් ලියා සහතික කරන ලද 2008 ජූනි 30 දාතම හා අංක. 480 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "කයාටා ලොජිස්ටික්ස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන චමින්ද ජනප්‍රිය දිසානායක යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන් ලක්ෂ දහතුන් දහස් පන්සිය අසූ හයයි ශත දහ නමයක (රු. 313,586.19) මුදලක් 2010 මැයි 03 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් තුන් ලක්ෂ දහතුන් දහස් පන්සියඅසූ හයයි ශත දහ නමයක (රු. 313,586.19) මුදලද 2010 මැයි 04 දින සිට අංක 480 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ විසිපන් දහසක (රු. 225,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි පහක් (25%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 480 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ ගඟබොඩ පත්තුවේ පට්ටියගම ග්‍රාමයේ පිහිටි "ෆිට්ස්රෝයි එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. ජේ. ලියනගේ යන අය විසින් සාදන ලද 1992 මාර්තු 07 දාතම හා අංක 6264 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 13 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : ලොට් 14 ගිණිකොණට : අංක 429 දරන පිඹුරේ ලොට් 101 නිරිතට : ලොට් 12 සහ වයඹට : ලොට් 4 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (අක්. 0, රූ. 0, පර්. 11) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක. 6264 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D424/138 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 429 දරන පිඹුරේ ලොට් 101 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-142/2

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය.

ණය ගිණුම් අංකය : 244648 සහ 174019
ලේක් ලන්ඩ් ඉන්ටර් ඇමරිකන් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සිවරාසා සිවනාදන්

2010 පෙබරවාරි මස 24 වන දින පවත්වනලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස සම්මත කරගන්නා ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. පී. පෙරේරා විසින් 2005 ජූනි මස 23 වන දින සහතික කරන ලද අංක 381 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්මලාන බොරුපන, වළගම්බා මාවතේ අංක 09 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ශ්‍රී ලංකාවේ නිසි ලෙස ස්ථාපිත කරන ලද ලේක් ලන්ඩ් ඉන්ටර් ඇමරිකන් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමය ණයකරු හැටියටද සහ සිවරාසා සිවනාදන් උකස්කරු හැටියටද පැහැර හැර ඇති හෙයින්ද,

සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2003 ඔක්තෝබර් මස 15 වන දින සහතික කරන ලද අංක 2284 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිවරාසා සිවනාදන් ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින්ද එකී බැඳුම්කර යටතේ රුපියල් දොළොස් මිලියන හාරසිය අසූපන්දහස් දෙසීය දහසයයි ශත අනූහතක (රු.12,485,216.97) මුදලක් 2009 අගෝස්තු මස 11 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සීට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දොළොස් මිලියන හාරසිය අසූපන්දහස් දෙසිය දහසයයි ශත අනූහතක (රු.12,485,216.97) මුදල අයකර ගැනීම සඳහා 2009 අගෝස්තු මස 12 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 8,550,000 ක මුදල මත 22% ක වැඩි දුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම්ද දරන ලද වෙනත් වියදම් වෙතොත් ඒවාද මෙතෙක් ලබා ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 381 සහ 2284 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇත්තාවූද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99 හි බලයලත් වෙන්දේසිකාරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන)

පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

1. අනුඥාලත් මිනින්දෝරු එච්. එම්. ප්‍රනාන්දු විසින් 1960 මාර්තු මස 12 වන දින සාදන ලද අංක 726 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ පෙර මොරටුව නගර සභා සීමාවන් තුළ වූ දැන් මොරටුව මහ නගර සභා සීමාවන් තුළ තෙලවල ග්‍රාමයේ (බොරුපන ෆෙරී පාරෙන් එහා) වළගම්බා මාවත දිගේ පිහිටි ලේඩි කැතරින් වතු සමූහයේ ගොඩනැගිලි සහ එහි පවත්නා අනෙකුත් සියළුදේත් සමග බෙදා වෙන් කර ඇති ලොට් 40 ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම් උතුරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 39 ද, නැගෙනහිරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 73 ද, දකුණට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 41 ද, බස්නාහිරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 38 ද (මාර්ග වෙන්කරය) යන මායිම් තුළ එකී පිඹුරු අංක 726 ට අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම නුගේගොඩ - දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ M2715/196 වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

2. අනුඥාලත් මිනින්දෝරු එච්. එම්. ප්‍රනාන්දු විසින් 1960 මාර්තු මස 12 වන දින සාදන ලද අංක 726 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ පෙර මොරටුව නගර සභා සීමාවන් තුළ වූ දැන් මොරටුව මහ නගර සභා සීමාවන් තුළ තෙලවල ග්‍රාමයේ (බොරුපන ෆෙරී පාරෙන් එහා) වළගම්බා මාවත දිගේ පිහිටි ලේඩි කැතරින් වතු සමූහයේ බෙදා වෙන් කර ඇති ලොට් 41 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම් උතුරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 40 ද, නැගෙනහිරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 72 ද, දකුණට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 42 ද, සහ බස්නාහිරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 38 (මාර්ග වෙන්කරය) ද, යන මායිම් තුල එකී පිඹුරු අංක 726 ට අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0. පර්. 20) විශාල ඉඩම නුගේගොඩ - දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ M2715/197 වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

3. අනුඥාලත් මිනින්දෝරු එච්. එම්. ප්‍රනාන්දු විසින් 1960 මාර්තු මස 12 වන දින සාදන ලද පිඹුරු අංක 726 හි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ පෙර මොරටුව නගර සභා සීමාවන් තුළ වූ දැන් මොරටුව මහ නගර සභා සීමාවන් තුල තෙලවල ග්‍රාමයේ (බොරුපන ෆෙරී පාරෙන් එහා) වළගම්බා මාවත දිගේ පිහිටි ලේඩි කැතරින් වතු සමූහයේ බෙදා වෙන් කර ලොට් 42 ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම් උතුරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 41 ද, නැගනෙහිරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 71 ද, දකුණට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 43 ද සහ බස්නාහිරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් (මාර්ග වෙන්කරය) ලොට් 38 ද යන මායිම් තුල එකී පිඹුරු අංක 726 ට අනුව පර්චස් විස්සක් (අ.0, රූ. 0, පර්. 20) විශාල ඉඩම නුගේගොඩ-දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ M2349/220 වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

මතු කියවෙන මාර්ග වෙන්කරය තුලින් ඉහලින් සහ ඔස්සේ යාමේ අයිතියද එක්වය.

පෙර කී තෙලවල ග්‍රාමයේ බොරුපන ෆෙරී පාරට එහා ලේඩි කැතරින් සමූහ වතුයායේ (දැන් වළගම්බා මාවත යැයි පවසන මාර්ග වෙන්කරය) බෙදා වෙන් කර ලොට් 38 ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : බොරුපන ෆෙරී පාර ද, නැගෙනහිරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් 39, 40, 41, 42, 43, 44, 45,46 47, 48, 49, 50, 51, 52, 53, 54, 55 සහ 56 ද, දකුණට : වත්තේ පාර සහ බස්නාහිරට : එකී පිඹුරු අංක 726 හි සඳහන් ලොට් අංක 20, 21, 22, 23, 24, 25, 26, 27, 28, 29, 30, 31, 32, 33, 34, 35, 36, සහ 37 ද යන මායිම් තුල එකී පිඹුරු අංක 726 ට අනුව රූඩ් දෙකයි පර්චස් විසිහතරයි දශම හතරක් (අ. 0, රූ. 2, පර්. 24.4) විශාල ඉඩම නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ M1154/122 වෙළුම පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

08-86

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| අගෝස්තු | 2010.08.06 | සිකුරාදා | 2010.07.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.13 | සිකුරාදා | 2010.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.20 | සිකුරාදා | 2010.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.27 | සිකුරාදා | 2010.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2010.09.03 | සිකුරාදා | 2010.08.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.09 | බ්‍රහස්පතින්දා | 2010.08.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.17 | සිකුරාදා | 2010.09.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.24 | සිකුරාදා | 2010.09.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2010.10.01 | සිකුරාදා | 2010.09.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.08 | සිකුරාදා | 2010.09.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.15 | සිකුරාදා | 2010.10.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.21 | බ්‍රහස්පතින්දා | 2010.10.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.29 | සිකුරාදා | 2010.10.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්‍ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.